# සමාජවිද්‍යාව

## විවරණාත්මක ලිපි

ඒ. කේ. පී. ජයසිංහ

එන්. වී. පී. ඒ. හේමන්ත කුමාර

Scanned with CamScanner

# සමාජවිද්‍යාව

## විවරණාත්මක ලිපි

ඒ. කේ. ජී. ජයසිංහ.
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සමාජවිද්‍යා අධ්‍යානාංශාධිපති, රුහුණු විශ්වවිද්‍යාලය.)
එන්. වී. ජේ. ඒ. පත්මන්ත කුමාර.
(කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යනාංශය, රුහුණු
විශ්වවිද්‍යාලය.)

ප්‍රකාශනය
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පොත් ප්‍රකාශකයෝ සහ බෙදාහරින්නෝ
675, මරදාන පාර, කොළඹ - 10

Scanned with CamScanner

Scanned with CamScanner

# පෙරවදන

සාමූහික වශයෙන් ජීවත් වන මනුෂ්‍යයා පිළිබඳ විද්‍යාත්මක ගවේෂණයක් ලෙසින් ද, සමාජය තුළ වෙසෙන්නාවූ මිනිසාගේ හැසිරීම් රටාව ගැන ඉගැන්වෙන විද්‍යාවක් ලෙසින් ද, සමාජවිද්‍යාව ඉතා කෙටියෙන් හඳුන්වා දිය හැකිය. සමාජවිද්‍යාව, සමාජය තේරුම් ගැනීමෙහිලා අර්ථවත්ව යොදාගත හැකි සංවාදශීලී විෂයයක් හැටියට ද සමාජ විද්‍යාඥයෝ හඳුන්වති.

සමාජවිද්‍යාව වර්තමානයේ මේ රට ඉතා ජනප්‍රිය විෂයයක් බවට පත් වී ඇත. විශ්වවිද්‍යාලවලත්, පිරිවෙන්වලත්, වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලත් කාර්මික හා අභ්‍යාස විද්‍යාලවලත්, මේ විෂය හදරණ විද්‍යාර්ථීන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවන ප්‍රවනතාවක් දැන් දැන් දක්නට ලැබේ. සංවර්ධන ක්‍රියාදායමයන්හිදී මෙන්ම මිනිසාගේ සාමාන්‍ය ජීවිතයේදීත් සමාජ සිද්ධාන්ත පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම් වර්තමානයේ අත්‍යවශ්‍ය කරුණක් බවට ද පත්වී ඇති සෙයක් පෙනේ.

සමාජවිද්‍යාව හදාරණ විද්‍යාර්ථීන්ට අද මුහුණ පෑමට සිදුවී ඇති මූලික දුෂ්කරතාව වන්නේ, එකී විෂයය අළලා සිංහල භාෂාවෙන් ලියැවුනු පතපොත හිඟකමයි.

මේ විෂයය හෙළ බසින් උගැන්වීම් ආරම්භ කොට දැනට දශක කීපයක් ඉක්ම ගොස් ඇතත්, ඒ සඳහා අධ්‍යයනය කිරීමට තරම් ප්‍රමාණවත් පොතපත හෙළබසින් බිහිවී නොමැතිවීම ඉමහත් අඩුපාඩුවකි. මෙවන් තත්ත්වය එකී විෂයයන්ගේ අභිවර්ධනයට මෙන්ම, සිංහල භාෂා මාධ්‍යයෙන් සමාජ විද්‍යාව විෂය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද ඉමහත් බාධකයක් වී ඇති බව පෙනේ.

මෙවන් අවදියෙක සමාජවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳව විවිධ මාතෘකා යටතේ රුහුණු විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යනාංශයේ ආචාර්ය භවතුන් දෙදෙනකු වූ ඒ. කේ. ජී. ජයසිංහ සහ එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර යන මහත්වරුන් විසින් ලියන ලද සරල ශාස්ත්‍රීය ලිපි 9 ක් ඇතුළත් **"සමාජ විද්‍යාව - විවරණාත්මක ලිපි"** නමැති මේ ග්‍රන්ථය බිහිවීම විශේෂයෙන් අගය කළයුතු කාලෝචිත ප්‍රයත්නයකි.

සමාජයට බෙහෙවින් වැඩදායක වූ කරුණු ප්‍රස්තුත කරගෙන ඒවා සමාජ විද්‍යානුකූලව විවරණය කිරීමට මෙහි කතුවරුන් උත්සුක

Scanned with CamScanner

වී ඇති බව පෙනේ. විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙන්ම සෙසු විද්‍යාර්ථීන්ට ද, සමාජවිද්‍යාව විෂය කෙරෙහි උනන්දුවක් දක්වන සාමාන්‍ය පාඨකයන්ට ද මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු නිසැකය. එමෙන්ම කාටත් පහසුවෙන් තේරුම් ගතහැකි වන පරිදි සරල සුගම බසින් මෙම ලිපි ඉදිරිපත් කර තිබීම ද විශේෂත්වයෙන් සඳහන් කළයුත්තකි.

අප විශ්වවිද්‍යාලයේ මෙම ආචාර්යවරුන් දෙනොගේ වෑයම මම බෙහෙවින් අගය කරමි. ඒ පිළිබඳව මෙම කතුවරුන් දෙනොට මුළුහදින් මා ආශිර්වාද කරන අතර, සමාජ විද්‍යාත්මක ඥානය වැඩිදියුණු කරවීමෙහිලා ඉවහල්වන අන්දමේ පරිපූර්ණවූත්, පර්යේෂණාත්මක වූත්, කෘතීන්, මේ විෂය යටතේ තව තවත් ඔවුන් අතින් නිර්මාණය වේවා යි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය සත්‍යපාල පිත්තදූවගේ
උපකුලපති

රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.
1996.10.10

## පටුන


| | | |
|---|---|---|
| 01. | සිංහල අභිචාර. | 11 |
| 02. | බුදුරජාණන් වහන්සේ - ලොව පහළ වූ ප්‍රථම මහා සමාජ විද්‍යාඥයා | 33 |
| 03. | ආයුර්වේද ජීවන දර්ශනය. | 52 |
| 04. | ප්‍රොතෙස්තන්ත බුදුදහම | 63. |
| 05. | මහනුවර ඇසළ පෙරහැර. | 76 |
| 06. | සිංහල - හින්දු අලුත් අවුරුද්දෙහි සමාජ විද්‍යාත්මක පදනම. | 84 |
| 07. | විවාහක කාන්තාවන්ගේ ජාත්‍යන්තර සංක්‍රමණ හා පවුල් සංස්ථාවේ ගැටලු. | 92 |
| 08. | ලංකා සමාජයේ සියදිවි නසාගැනීම්. | 99 |
| 09. | සේවක අභිප්‍රේරණය. | 111 |


Scanned with CamScanner

04

# ප්‍රොතෙස්තන්ත බුදුදහම

## ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරයේ යුරෝපීය පසුබිම :

සැක්සන් නම් ජර්මන් රාජ්‍යයේ දේවස්ථානයක් වූ 'විටන්බර්ග්' හි ආගමික කාර්යයන්ට විරුද්ධ ව ප්‍රත්‍ය 95 කින් යුත් පත්‍රිකාවක් ක්‍රි. ව. 1517 දී ඒ දේවස්ථානයේ ම පූජකවරයෙකු වූ මාර්ටින් ලූතර්[1] විසින් ඉදිරිපත් කරන ලදී. එයින් ඇරඹි ව්‍යාපාරයක් යුරෝපය තුළ සාම්ප්‍රදායික ආගම අබිබවනය කරමින් නැඟී සිටි අතර ඒ ව්‍යාපාරය පසු ව 'ප්‍රොතෙස්තන්ත'[2] යන නාමයෙන් සංකල්ප කර ඇත. ඉන් අවධානයට ලක් කළ අදහස් යුරෝපීය සමාජයේ දේශපාලනික ආගමික හා සාංස්කෘතික වෙනසකට දායකත්වය සැපයී ය. ඊට හේතුව මෙකී ව්‍යාපාරයේ අදහස් එවකට වර්ධනය වෙමින් සිටි මධ්‍යම පාංතික කොටස් මහත් ආශ්වාදයකින් වැළඳ ගැනීම යි. එතෙක් අලෞකිකවාදී මූලධර්ම දේශනා කළ සාම්ප්‍රදායික ක්‍රිස්තියානි ආගමට ප්‍රතිපක්ෂව නව ලෞකිකවාදී මූලධර්ම රැසක් ප්‍රොතෙස්තන්ත ආගමික ව්‍යාපාරය මගින්

---

(1) ක්‍රි. ව. 1483-1564 කාලයේ ජීවත් වූ සුප්‍රකට ප්‍රතිසංස්කරණවාදියෙකි. ජර්මනියේ ප්‍රොතෙස්තන්ත වාදයේ (ලූතර්වාදය) නිර්මාතෘවරයා ය. ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය මගින් ජර්මන් රාජ්‍යයේ දේශපාලනික කැරලි දෙකක් ඇති කිරීමට සමත් විය. එනම්,

- ෆාන්ස් පොන්සිකීජන්ගේ නායකත්වය යටතේ ක්‍රි. ව. 1523 දී වූ රදළ කුලීනයන්ගේ පහළ කොටසේ කැරැල්ල.
- ක්‍රි. ව. 1525 දී වූ ගොවි ජනතාවගේ මහා යුද්ධය යනුවෙනි. මේ කැරලි දෙක ම පරාජය වූ අතර ඉන්පසු ලූතර්ගේ තැන ජෝන් කැල්වින් (1509-1564) ගත්තේ ය. කැල්වින්ගේ දෘෂ්ටිය එකල ධනපති පංතියේ නිර්භය කොටසට උචිත වූවක් විය.

(2) ලූතර්ගේ අනුගාමික ජර්මන් පාලකයන් කොටසක් අධිරාජ්‍යයාගේ ආඥාවට විරෝධය පෑම නිසා 'ප්‍රොතෙස්තන්ත' හෙවත් 'විරෝධය' යන නම ඒ ආගමික ව්‍යාපාරය සඳහා ක්‍රි. ව. 1529 අප්‍රේල් 29 දින සිට භාවිත වන්නට යෙදුණි.

Scanned with CamScanner

ඉදිරිපත් කරන ලදී. එනම්, ධනය ඉපයීමේ වැදගත්කම ආවධානයට ලක් කළ බව යි. මේ ප්‍රොතෙස්තන්ත ආගමික ව්‍යාපාරය හා ධනවාදයේ උදාව අතර ඇති සම්බන්ධතාව අධ්‍යනය කළ ජර්මන් ජාතික මැක්ස්වෙබර් (Max Weber, 1864-1920) ***The protestant Ethic and the spirit of capitalism*** (ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම හා ධනවාදයේ සාරය)නම් කෘතිය රචනා කර ඇත. ධනේශ්වරයේ දියුණුව ඇති කිරීමට අවශ්‍ය මතවාදී අනුබලය සපයා දෙනු ලැබුයේ ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරයෙන් බව වෙබර්ගේ අදහස යි. ඔහුගේ කෘතියට අනුව ප්‍රොතෙස්කන්ත ව්‍යාපාරය මගින් අවධානයට ලක් කළ ලෞකිකවාදී මූලධර්ම සමහරක් නම් :

* කාලය ධනය හා සමාන ය. කාලය සමඟ ධනය ද වර්ධනය වේ. ධනය වර්ධනය ඇනහිට කාලය පමණක් වර්ධනය වේ නම්, එය නාස්තියකි. එබැවින් වැඩියෙන් වැඩ කිරීමට සහ වැඩියෙන් ධනය ඉපයීමට මහන්සි වන්න.

* මුදල් ඉපයීම වනාහි එයට අර්ථය හා ගුණය කැටි කර ගත් ක්‍රියාවකි. එබැවින් රැකියාව වෘත්තියක් ලෙස කළ යුතු අතර ඒ ක්‍රියාවලියේ දී සම්පූර්ණයෙන් ම ඇප කැප වී මුදල් එකතු කිරීම කළ යුතුය. මුදල් එකතු කිරීම ම ඉතිරි කිරීම ම පමණක් පලදායී නො වේ. ඒවා පලදායී ආයෝජනවල යෙදවිය යුතු බව ද අමතක නො කරන්න.

* මුදල් බොහෝ පලදරන බව අමතක නො කරන්න. මුදලට මුදල් උපයන්නට පුළුවන. ඒ උපයන මුදල් තවත් මුදල් උපයනු ඇත. එය අඛන්ඩ ක්‍රියාවලියකි. සිලිං පහ-හයක් ද, හය-හතක් ද යනු විසින් සියයක් වනු ඇත. ලාභය වැඩි වන විට ලාභයේ වැඩි වීමේ වේගය ද වැඩි වනු ඇත.

* විශ්වාසය යනු මුදල් බව අමතක නො කරන්න. කෙනෙකු ඔහුගේ මුදල් විශ්වාසය මත මා වෙත තැබීමෙන් ඔහු මට පොලියක් ද දෙයි. ඒ මුදල් මා සතු ව ඇති කාලය තුළ ඒ මුදලින් හැකිතාක් මට උපයා ගත හැක.

* මුදල් එකතු කළ යුත්තේ එය කළ යුතු නිසා ම නො වේ. ඒ සඳහා තමාට ඇති යුතුකම ඉටු කිරීමේ වගකීමක් වසයෙනි. ඒ යුතුකම දෙවියන් වහන්සේ වෙනුවෙන් තමා විසින් කළ යුත්තකි.



Scanned with CamScanner

* ධනය ඉපයීම අත්තකිලමතානුයෝගී දෘෂ්ටියකින් කළ යුතු ය. වැඩි පුර ලාභ ලැබීම යනු ඉක්මනින් මෝක්ෂය වෙත ලගා වීම යි. කාර්යක්ෂම නිෂ්පාදනයේ යෙදීම යනු මෝක්ෂයට වඩ වඩාත් සමීප වීම බව අමතක නො කරන්න.

* මේ ප්‍රකාශය අමතක නො කරන්න. 'හොඳ පඩි ගෙවන්නෙකු තවෙකෙකුගේ මුදල් පසුම්බියේ ස්වාමියා ය.

* යමෙකුගේ ණය කෙරෙහි බල පාන ඉතා නො වැදගත් ක්‍රියාවන් ද සැලකිල්ලට ගනු ඇත. පාන්දර පහට හෝ රාත්‍රී අටට ඔබේ මිටියේ හඬ ඇසෙන විට ණය හිමියාට මාස හය දීර්ඝ කාලයක් වේ. එහෙත් ඔබ බිලියට් මේසයක හෝ තැබෑරුමක සිටිනා අයුරු දකින ණය හිමියා පසු දින ණය මුදල් ලබා ගැනීමට ඔබ හමුවට එනු ඇත.

* ඔබ ඔබේ ණය ගැන සැලකිලිමත් වන්නේ නම් එය ඔප්පු කරන්නේ ඔබගේ සැලකිල්ල පමණක් නො ව අවංකත්වය ද වේ.

* ඔබ සතු සියලු දෑ පිළිබඳ ව සැලකිලිමත් වන්න. ඊට අනුකූල ව ජීවත් වන්න. බොහෝ ණය කාරයින්ගේ පිරිහීම අප්‍රමාද ව සිදු වේ. මෙය වළක්වාලීමට ඔබගේ ආදායම හා වියදම පිළිබඳ ව නිවැරදි ගිණුම් තබන්න. ඉතා කුඩා නො වැදගත් වියදම් විශාල මුදලක් ගිල ගන්නා බව ඔබට පෙනී යනු ඇත. එවිට ඔබ කුමක් වී ඇත් ද යන්න තේරුම් ගන්නා අතර ඉත් අනාගතය ආරක්ෂා වනු ඇත.

* වසරක දී ඔබ පවුම් හයක් වෙනුවෙන් පවුම් සියයක ප්‍රයෝජන ලබයි. එසේ වන්නේ ඔබ දක්ෂ සහ අවංක පුද්ගලයෙකු වන කල්හි පමණි. කෙනෙකු කුසීත ව දිනකට එක් රිදී කාසියක් වැය කරයි. ඉහත සඳහන් පවුම් හය කුසීත ව අවුරුද්දක දී වැය කරයි.

* කෙනෙකු සිලිං පහක් වටිනා කාලය දිනක දී විනාශ කළහොත් ඔහු අවසානයේ සිලිං පහක් තමාට අහිමි කරගන්වා පමණක් නො ව සිලිංපහක් වියදම් කළා හා සමාන ය.

* සිලිං 5ක් අහිමි කර ගැනීමෙන් ඔහුට සත්‍ය වශයෙන්ම අහිමි වන්නේ ඒ ගණන පමණක් ම නො වේ. සිලිං 5 හා සම්බන්ධ සියළු ගණුදෙනු ද අහිමි කර ගනී. බාලයෙකු වැඩිහිටියෙකු වන්නා සේ ඒ සිලිං පහ කාලයාගේ ඇවෑමෙන් සැලකිය යුතු මුදලක් වේ.

***(The protestant etheic and the spirit of capitalism p.50)***



Scanned with CamScanner

මේ සියල්ල සම්බන්ධයෙන් වෙබර් එළඹෙන ප්‍රධාන නිමනය වන්නේ 'සමාජයක ප්‍රාග්ධනය හා තාක්ෂණය යම් තාක් මට්ටමකට වැඩි දියුණු වූවිට ඒ සමාජය සාම්ප්‍රදායික තත්වයෙන් මිදී වඩා තාර්කික වූ සමාජ ක්‍රමයක් දක්වා වර්ධනය වන්නේ ඊට උචිත මතවාදී අනුබලයක් සැපයුන හොත් පමණි' යන්නයි. බුදු දහම, හින්දු ආගම, සාම්ප්‍රදායික කතෝලික ආගම වැනි පරලොවට බර වූ ආගම් මගින් මෙවැනි මතවාදී වෙනසක් ඇති කළ නොහැකි බව වෙබර් අවධාරනය කරයි. නමුත් මාර්ටින් ලූතර් ප්‍රමුඛ පිරිස ඉදිරිපත් කළ ප්‍රෙතෙස්තන්ත ආචාර ධර්ම මගින් ගිහි ජීවිතයේ එදිනෙදා කටයුතුවලට ආගමික මුහුණුවරක් දීමට උත්සාහ ගෙන ඇත. ඒ නිසා ම ඒ සමාජය තුළ ධනය ඉපයීමටත්, ඒවා ආයෝජනයටත්, ව්‍යාපාර පවත්වාගෙන යාමටත් වැනි ලෞකික උවමනාවන් සඳහා ආගමික මතවාද භාවිත කරන්නට යෙදුනි.

## ලාංකික ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය :

යුරෝපය තුළ සාම්ප්‍රදායික ක්‍රිස්තියානි ආගමික මූලධර්මයන්ට ප්‍රතිපක්ෂව ප්‍රොතෙස්තන්ත ආගමික ව්‍යාපාරය වැඩී ගිය ආකාරයට ම ඊට සමාන ලක්ෂණ ලාංකික බුදු දහම තුළ ද ඇත. එනම්, සාම්ප්‍රදායික ථෙරවාදී බුදු දහම හා එහි මතවාදී නවීකරණය තුළ ප්‍රොතෙස්තන්ත ලක්ෂණයෝ දක්නට ලැබෙන බව යි. ක්‍රි. පූ. 3 වැනි සියවසේ දී ලංකාවට ගෙන එන ලද්දේ ථෙරවාදී බුදු දහම (ත්‍රිපිටක බුදුදහම) යි. එහි පරම නිට්ඨාව වන්නේ 'නිවන' ලබා ගැනීම ය. මේ අලෞකික වාදී මතයෙන් බැහැර ව වෙනත් ලෞකික අරමුණු සඳහා බුදු දහම යොදා ගැනීම පසු කාලීනව සි දු වේ.

ථෙරවාදී බුදු දහමේ වූ මේ වෙනසට හේතු පැහැදිලි කරන 'ගනනාථ ඔබේසේකර' සමාජ ක්‍රමයේ හා දේශපාලන ක්‍රමයේ වෙනස්කම් පෙන්වා දේ. ශත වර්ෂ එක හමාරක් පමණ වූ ඉංග්‍රීසි පාලන කාලය තුළ ආසන්න වසයෙන් දශක හයකට වැඩි කාලයක් ලංකාවේ අධ්‍යාපන ඒකාධිකාරය සම්පූර්ණයෙන් ම ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාර සතු විය. මේ කාලය තුළ ක්‍රිස්තියානි පූජකවරුන් බෞද්ධයන්ට කළ අභියෝගයේ ප්‍රතිපලයක් ලෙස බෞද්ධ - ක්‍රිස්තියානි වාද පහක් ඇති වුනි. ඒවා මෙසේ ය.

i. බද්දේගම (1864).
ii. වරාගොඩ (1865).
iii. උදම්මිට (1871).



Scanned with CamScanner

iv. ගම්පොළ (1871).
v. පානදුර (1873).

බෞද්ධ භික්ෂූන් වහන්සේලා මිෂනාරි පූජකවරුන් සමඟ මුහුණට මුහුණ ලා කළ මේ වාද විවාදවල ප්‍රමුඛත්වය හික්කඩුවේ ශ්‍රී සුමංගල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද, බුලත්ගම ධර්මාලංකාර, යන හිමිවරු උසුලන ලදී. මේ වාදවලින් මිෂනාරීන් පරාජය කර ජය ගත් බෞද්ධයන් තුළ මිෂනාරි අධ්‍යාපන ක්‍රමයෙන් මිදී තමන්ගේ අධ්‍යාපන ක්‍රමයක් ගොඩනගා ගැනීමේ අභිලාෂයක් විය.

එවකට ලංකාවේ සිටි යුරෝපීය පුවත්පත් කලාවේදියෙකු වූ 'ජෝන් කූපර්' පානදුරාවාදය සම්බන්ධයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් රචනා කළ ග්‍රන්ථයක් යුරෝපය තුළ විශාල වශයෙන් ප්‍රචලිත විය. එය කියවූ ඇමරිකන් ජාතික නීතිඥයෙකු වූ 'හෙන්රි ස්ටීල් ඕල්කට්' හා 'හෙලේනා පෙට්‍රෝව්නා බ්ලවට්ස්කි' යන පරමවිඥානාර්ථ සමාගමේ (පරම විඥානාර්ථ සමාගමේ මව් ශාඛාව 1875 දී නිව්යෝර්ක්වල පිහිටුවා ඇත.) සාමාජිකයෝ 1880 දී ලංකාවට පැමිණියහ. මොවුන්ගේ පැමිණීම තමන්ගේ අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙන් සිටි ලාංකිකයන් දිරිමත් කරන සුළු විය. ඕල්කට්තුමාගේ ප්‍රධානත්වයෙන් 1880 දී 'ලාංකික පරම විඥානාර්ථ සමාගම' පිහිටුවා ගත් අතර එය බෞද්ධ අධ්‍යාපනයට ජීවයක් ලබා දුණි. ඕල්කට්තුමා බෞද්ධ අධ්‍යාපන අරමුදලක් ඇති කිරීමේ අවශ්‍යතාව තේරුම් ගෙන ඒ සඳහා මුදල් එකතු කිරීමට ගම්වල සංචාරය කළේ ය. ඔහුට පසු ව 'ලෙඩ් බීටර්' 'ඩාලි' සහ අනගාරික ධර්මපාලතුමා (1864-1933) මේ කටයුතු දිගට ම කරගෙන ගියහ. පරම විඥානාර්ථ සමාගම මගින් කරන ලද සියලු සත් ව්‍යාපාරයන්ට සහාය දුන් අනගාරික ධර්මපාලතුමා 1892 දී 'මහාබෝධි සමාගම' ඇරඹී ය. ලංකාවේ ගිහි පැවිදි නායකයන්ගේ ද ආධාරය ලැබූ මේ සංගම් බෞද්ධ ව්‍යාපාරය නූතන පදනමක තබා ක්‍රිස්තියානි මිෂනාරීන් හා තරඟ කළ හැකි තත්වයට පත් කළේ ය. "සිංහල බෞද්ධයා" පත්‍රය ඇරඹීම, "දැන ගත යුතු කරුණු" නමින් ධර්මපාලතුමා ලියූ කෘතිය, "බ්‍රිතාන්‍ය බෞද්ධයා" නමින් ඉංග්‍රීසි සඟරාවක් නිකුත් කිරීම, මහනුවර සාමණේර විද්‍යාලයක් ඇරඹීම යන කරුණු අවධානයට ලක් විය යුතු ය. (එමෙන් ම 1969 දී රජයේ ප්‍රසිද්ධ අනුශාසනා දෙපාර්තමේන්තුව ඇරඹීමත් සමඟ බෞද්ධයන්ට පිරිවෙන් නො වූ පාසල් ඇරඹීමට අවස්ථාව උදා වුණි.) ඒ අනුව මේ ව්‍යාපාර මගින් ලාංකියන් අපේක්ෂා කළ පරිදි නව පාසල් පද්ධතියක් හඳුන්වා දුනි. මේ බෞද්ධ අධ්‍යාපන ආයතන අතර මුලින් ම ආරම්භ කළේ ඉරිදා දහම් පාසල් ය. පසු ව, කොළඹ ආනන්ද හා නාලන්ද විද්‍යාල, ගාල්ලේ මහින්ද විද්‍යාලය, මාතර රාහුල විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලය ආදී

Scanned with CamScanner

වසයෙන් ඉංග්‍රීසි බෞද්ධ පාසල් අරඹන ලදී. මේ නව පාසල් පද්ධතියත් සමග පෙර තිබූ අධ්‍යාපන ක්‍රමයේ යම් වෙනසක් ඇති වුවත් එය උඩු යටිකුරු වූ වෙනසක් නො වේ. අරඹන ලද බෞද්ධ පාසල්වල අධ්‍යාපන තත්වය මූලික වසයෙන් මිෂනාරී පාසල්වලට සමාන විය. එනම්, මිෂනාරී ආකෘතියෙන් යුක්ත පාසල් ක්‍රමයක් බෞද්ධ ලාංඡනය යටතේ ආරම්භ කළ බව යි. මේ නව බෞද්ධ පාසල්වල ඉගැන්වීම සඳහා බඳවාගත් ගුරුවරු බොහෝ දෙනෙක් මිෂනාරී පාසල්වලින් අධ්‍යාපනය ලද අය යි. ඔවුන්ගේ ඉගැන්වීම් හරහා ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම මේ බෞද්ධ ප්‍රභූ සංස්කෘතිය තුළට ද ඇතුල් විය. එය පෝෂණය කිරීමට මේ බෞද්ධ පාසල්වල මිෂනාරී ක්‍රමයට අනුගත ව සැකසුණු විෂය මාලාව, විෂය බාහිර කටයුතු, පරිපාලන ව්‍යූහය යන සියල්ල උපකාරී විය. විෂය බාහිර කටයුතු වසයෙන් ක්‍රිකට් (Cricket) වැනි ක්‍රීඩා, හවුස් (House), හවුස් මීට් (House meet) වැනි මිෂනාරී පාසල්වල වූ අංගෝපාංග මේ පාසල්වල ද දක්නට ලැබුණි. මිෂනාරී පාසල්වල දක්නට ලැබුන මොනිටර් (Moniter) ප්‍රිපෙක්ට් (Prefect) වැනි අංගයන්ගෙන් ද මේ පාසල් සමානුපාතික විය. මේ පාසල්වල උගන්වන මාධ්‍යය වූයේ ද ඉංග්‍රීසි ය. ලාංකික බෞද්ධයා ආචාර සමාචාර දක්වන ක්‍රමයන් වෙනුවට මිෂනාරී පාසල්වල ගුඩ් මෝනිං, බායි, හායි, වෙරියෝ, තැන්ක් යූ වැනි පද භාවිත විය. මේ අනුව අලුතින් බිහි වූ පාසල් බෞද්ධ කොඩිය යටතේ බිහි වූ තවත් බටහිර ආකෘතියේ පාසල් පද්ධතියක් විය.

ඇති වූ මේ බෞද්ධ ප්‍රබෝධය තුළ දක්නට ලැබුණ සුවිශේෂ ලක්ෂණය වන්නේ වෙරළබඩ ප්‍රදේශයේ ගොවිගම නො වූ කුල ඊට දැඩි උනන්දුවක් දැක්වීම යි.[3] ඒ කුල අතර කරාව, සලාගම, දුරාව ප්‍රමුඛ වේ. අමරපුර නිකායේ භික්ෂූන් මෙන් ම ගිහි නායකයන් එහි දී පුරෝගාමී ව කටයුතු කරන ලදී.[4] ඒ සාමාජිකයන්ගේ උසස් අධ්‍යාපන මට්ටම හා

---

(3) මේ පිළිබඳව කරන ලද සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක් ලෙස මයිකල් රොබට්ස්ගේ කරාව ප්‍රභූන්ගේ නැගීම නම් පර්යේෂණය පෙන්වා දිය හැක. Roberts, Michel -, *The Rise of karawa Elites in Sri Lanka,* (1500-1931) Lake House Investments Ltd 1980.

(4) අමරපුර නිකාය එහි දී පුරෝගාමී වීමට බලපාන ලද්දේ භික්ෂු සමාජය තුළ පවත්නා කුල ස්ථරායනය යි. ඒ ස්ථරායනය පිළිබඳ කෙටි වශයෙන් හෝ කරුණු දැන ගැනීමට පහත කෘතීන් උපකාර කර ගත හැක.

* රාහුල හිමි, වල්පොල **සත්‍යෝදය**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ 1992.
* මේධානන්ද හිමි, දේවාලේගම - **චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදය හැඳින්වීමක්**, ආරිය ප්‍රකාශකයෝ 1992 සැප්:
* ඥාණරත්න හිමි, වැලිගම - **ලක් බුදු සසුන.** බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව 1993.



Scanned with CamScanner

ධනවත් බව මේ පිබිදීමට ධෛර්යය සැපයී ය. එනම්, අලුතෙන් ධනවත් වූ මධ්‍යම පංතිය මේ බෞද්ධ ප්‍රබෝධයේ මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. විශේෂයෙන් මේ බෞද්ධ ප්‍රබෝධයට ආර්ථික ශක්තිය සපයා දුන්නේ ලංකාවේ බටහිර දිග වෙරළ බඩ ප්‍රදේශයේ අලුතෙන් බිහි වූ මධ්‍යම පංතිය යි. මේ මධ්‍යම පාංතික පිරිසෙන් බොහෝ දෙනෙකුගේ ධනවත්කම අරක්කු ව්‍යාපාරය මත පදනම් විය. ඒ අනුව මේ ප්‍රොතෙස්තන්ත බුදුදහම නම් සංකල්පය තුළ අලුතෙන් නැගී ආ බෞද්ධ ව්‍යාපාරික ප්‍රභූන් හා කතෝලික ප්‍රමුඛ සෙසු ව්‍යාපාරිකයන් අතර ඇති වූ සියුම් ගැටුම් ද නිරූපණය වේ.

මධ්‍යම පාංතිකයන් වෙත ප්‍රොතෙස්තන්ත ආචාරධර්ම අභ්‍යන්තරිකරණය වීමත් සමඟ බෞද්ධාගම තුළට ජනප්‍රිය ලක්ෂණ ඇතුලත් වේ. ඒ ජනප්‍රිය ලක්ෂණ ක්‍රිස්තියානි ආගම තුළ වූ ලක්ෂණවලට සමානුපාතික විය. ඊට නිදසුන් ලෙස ක්‍රිස්තියානි ආගමෙහි වූ කැරොල් ගීත ගායනා වෙනුවට භක්ති ගීත ද, එහි වූ නත්තල් සුභපැතුම්පත් වෙනුවට වෙසක්සුභ පැතුම් පත් ද, වෙසක් තොරණ, නාට්‍ය සන්දර්ශන, වෙසක් කුඩු වැනි සැරසිලි උපකරණ ද ඒ අතර මුල් තැනක් ගනී. දන්සැල් ද ඊට අයත් අංගයක් ලෙස සාකච්ඡා වේ. මේවාට පුරෝගාමී වන්නේ ද අලුතින් ධනය උපයාගත් මධ්‍යම පාංතික සාමාජිකයන් ය. මේ ක්‍රියාවලියත් සමඟ ම ලාංකික දේශපාලන ක්‍රමයේ වෙනස්වීම ඇරඹේ. ඕල්කට්තුමාගේ හා ධර්මපාලතුමාගේ ව්‍යාපාරවල ප්‍රතිඵල ඊට අනුබල සපයනු ලැබී ය. අනගාරික ධර්මපාලතුමා ඇති කළ සටන්කාමී බෞද්ධ ව්‍යාපාරය 1915 කැරැල්ලෙන් පසු උදාසීන බවක් පෙන්වූවත් එෆ්. ආර්. සේනානායක, ඩී. බී. ජයතිලක වැනි සිංහල බෞද්ධ නායකයන්ගේ ක්‍රියා පිළිවෙත යටතේ තව දුරටත් හොඳින් සංවිධානය විය. 1918 වන විට නොයෙක් නගරවල පිහිටුවන ලද තරුණ බෞද්ධ සංගම් (YMBA), තරුණ බෞද්ධ කාන්තා සංගම් සහ ඉරු දින දහම් පාසල් ද මේ වෙනසට සංවිධානාත්මක පදනම සැපයූවා පමණක් නො ව ඉන් සිංහල ප්‍රභූන්ට දේශපාලනික වසයෙන් සංවිධානය වීමේ හැකියාව හා ඉඩකඩ ද සපයා දෙනු ලැබී ය.1833 සිට 1912 දක්වා ලාංකික ව්‍යවස්ථාදායක සභාවේ පහතරට සිංහල නියෝජිතයා වූයේ ක්‍රිස්තු භක්තිකයෙකි. එබැවින් මේ නව බෞද්ධ ප්‍රභූන් ඊට විරුද්ධ ව නැගී සිටියේ දේශපාලන බලය ද අපේක්ෂාවෙනි. තම පාංතිකයන්ට දේශපාලන හා සංස්කෘතිමය වසයෙන් වරප්‍රසාද රාශියක් අහිමි වී ඇතැයි නව මධ්‍යම පංතිය කල්පනා කරන ලදී, එබැවින් ලාංකික බෞද්ධයා ක්‍රිස්තියානි ආගම මිථ්‍යාදෘෂ්ටික, පිළිකුල්සහගත, ප්‍රතික්ෂේප කළ යුතු ආගමක් ලෙස



Scanned with CamScanner

සැලකී ය. එමෙන් ම ඒ ආගම අදහන යුරෝපීන්ට ද ලාංකික බෞද්ධ ප්‍රභූන් විරුද්ධ වූ අතර ඔවුන් නියෝජනය කරන දේශපාලන තන්ත්‍රයට ද නැත හොත් අධිරාජ්‍යවාදී ආණ්ඩුවට ද විරුද්ධ විය. මේ තත්වය මත 1930 දශකයේ දී පවා දැකිය නො හැකි වුවවත් 1947 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට නියෝජිතයන් පත් කර ගැනීම සඳහා වූ දේශපාලන රැස්වීම්වල බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම දක්නට ලැබේ.

ඉංග්‍රීසි භාවිත කරන ක්‍රිස්තියානි ආගම අදහන පිරිසක් අත තිබූ දේශපාලන අධිකාරය 1956 න් පසු සිංහල කථා කරන බෞද්ධයන් අතට පත්වීමත් සමඟ ථෙරවාදී බුදු දහමේ නවීකරණය ඉක්මන් වූ බව ගනනාථ ඔබේසේකර (Gananatha Obeysekara) පෙන්වා දෙයි. මේ අන්දමින් ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම සමඟ සම්මිශ්‍රණය වූ ථෙරවාදී බුදු දහම 'ප්‍රොතෙස්තන්ත බුදුදහම' ලෙස හැඳින්වේ. නවීකරණයට ලක් වූ ථෙරවාදී බුදුදහම 'ප්‍රොතෙස්තන්ත බුදුදහම' නමින් සංකල්පගත කිරීම සාධාරණීකරණය කිරීමට මහාචාර්ය ගනනාථ ඔබේසේකර කරුණු දෙකක් ඉදිරිපත් කරයි. එනම්;

(1) ඇති වූ නව වෙනස්කම්වලින් පසු ව සැකසුන ථෙරවාදී බුදු දහම සංවිධානාත්මක ස්වරූපයෙන් හා ප්‍රතිමාන පද්ධතියෙන් ප්‍රොතෙස්තන්ත ආගමට සමාන වේ.

(2) ක්‍රිස්තියානි මිෂනාරී ක්‍රමයටත්, ඒ හා බැඳුණ දේශපාලන ක්‍රමයටත් විරුද්ධ ව නැඟී සිටීම.

යුරෝපයේ ප්‍රොතෙස්තන්ත ආගම මගින් ඇති කළ නව සංවිධානවල ප්‍රමුඛත්වය ගනු ලැබුයේ නාගරික මධ්‍යම පාංතිකයන් වූවා සේ ම ලංකාවේ ථෙරවාදී බුදුදහමේ මූලික මතවාද වෙනස් මගකට යොමු කිරීමට ජනතාවට මඟ පෙන්වීම කරන්නේ ද ගමේ පන්සල් නො ව නාගරික පන්සල් ය. මේ අනුව ම ලාංකික ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය ද මහා සම්ප්‍රදය[5] (Great Tradition) තුලින් ඇරඹෙන බව පෙනී යයි. එහි මූලික පියරක් ලෙස ජනාකීර්ණ නගරයන්හි පන්සල් ඉදිකිරීම හා බුදු පිළිම ඉදි කිරීමත් නගරයේ ඇතැම් මහා මාර්ග හඳුන්වා තිබූ නම් වෙස් කොට ඒවා බුදු දහමට සම්බන්ධ නාමවලින් නැවත හැඳින්වීමත්

(5) චූල සම්ප්‍රදය හා මහා සම්ප්‍රදය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට කියවිය හැකි ලිපියකි.
ද. සිල්වා, නලින් - චූල - මහා සම්ප්‍රදය යනු කුමක් ද.
"කාලය" 1989 මාර්තු කලාපය චින්තන පර්ෂදය (පිටු 24-27)

සිදු විය. එමෙන් ම නාගරික උද්‍යානයන් ද බුදුදහමට සම්බන්ධ නාමවලින් හැඳින්වීමත් දැකිය හැක. මේ සියල්ලට නිදසුන් කීපයක් ලෙස බෞද්ධාලෝක මාවත සංඝරාජ මාවත, අනගාරික ධර්මපාල මාවත, සංඝබෝධි මාවත සහ විහාරමහා දේවි උද්‍යානය, අනගාරික ධර්මපාල උද්‍යානය වැනි නාම පෙන්වා දිය හැකි ය. වෙනස්කම් මූලික වශයෙන් ලංකාවේ නාගරික ප්‍රදේශවල සිදු වනු දැකිය හැකි වුවත් විශේෂයෙන් ඒ වෙනස්කම් සඳහා නගර තෝරා ගැනීමේ දී කතෝලික බැතිමතුන් වැඩිපිරිසක් ජීවත් වන ප්‍රදේශවලට ප්‍රමුඛත්වය ලැබේ. නිදසුනක් ලෙස කළුතර, මොරටුව, පානදුර වැනි ප්‍රදේශ එවැනි වෙනස්කම්වලට බහුල ව භාජනය වූ නගරයන් ය. පල්ලිය සතු වූ නාගරික ඒකාධිකාරය පන්සලට මාරු වනු මින් පෙනී යයි. මේ ක්‍රියාවලියේ ප්‍රතිඵල ලෙස බොහෝ නගරවල හා සෑම සංදියක ම බුදුපිළිම හා බෝධි ප්‍රකාර පිහිටු වන ලදී. ඒ අනුව කොල්ලුපිටිය වටරවුමේ ලංකාවේ සිතියම් හතරක් පිහිටුවා ඒ එකිනෙක මැද මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ සටහන් කොට තිබිණ. මේ තත්වය මත නාගරික විහාරස්ථාන ග්‍රාමීය විහාරස්ථානවලට වඩා වෙනස් මඟක් අනුගමනය කරන්නට විය. ඒවා තුළ ජලය, විදුලිය, දුරකථන, යානවාහන වැනි නවාංගයන්ගෙන් පිරී යන්නට පටන් ගැනේ. එනම්, මින් ප්‍රකාශ වන්නේ ලෝකෝත්තර සැපතක් සඳහා දිශාගත වූ බුදුදහම ලෞකික අරමුණු උදෙසා යොමු වීම ඇරඹෙන බව යි. එලෙස ඇරඹී බුදු දහමේ ලෞකික මුහුණුවර අද වඩාත් තීව්‍ර වී ඇත. එයට කදිම නිදසුනක් ලෙස නිදහසින් පසු මෑත කාලීන දේශපාලනය හා බුදු දහම තව දුරටත් ලං කිරීම සඳහා කොළඹ නවම් මහා පෙරහැර 1978 දී ඇරඹීම දැක්විය හැක. පැරණි සමාජය තුළ නිංසල ග්‍රාමීය පරිසරයක් තුළ පන්සල පිහිටා තිබුණත් අද එය කලබලකාරී නාගරික වෙළඳ සංකීර්ණ ඉදිරියට ගෙන විත් ඇත. මෙවැනි විහාරස්ථාන තුළ සිට ලෝකෝත්තර සැපතක් සඳහා යොමු වීමට අවකාශ අඩු ය. එමෙන් ම පැරණි බෞද්ධ සම්ප්‍රදායට අනුව විහාරස්ථානයේ අලුතින් ඉදි කරන හෝ ප්‍රතිසංස්කරණය කරන ධර්ම ශාලාවට, මල් ආසනයට, බෝධි ප්‍රකාරයට, පියගැටපෙළට ගමේ සියලු දෙනාගේ දායකත්වය ලබා ගැනීම සිදු විය. නමුත් අද එවැනි සමූහික පදනමකින් තොර ව ඒ කටයුතු ඉටු කර දීමට නාගරික ව්‍යාපාරික මධ්‍යම පංතික ප්‍රභූන් ඉදිරිපත් ව ඇත. ඔවුන් ඒ කටයුතු සඳහා ඉදිරිපත් වන්නේ ලෝකෝත්තර තත්වයක් අමුණු කොට ගෙන නොව ලෞකික අපේක්ෂා ගොන්නක් මුදුන් පමුණුවා ගැනීමේ අටියෙනි. මින් සිදු වූයේ බෝධි ප්‍රකාරය, දන ශාලාව, මල් ආසනය තනි

Scanned with CamScanner

ව්‍යාපාරික ප්‍රභූවරයෙකුගේ නිර්මාණයක් වීම යි. එමෙන් ම එය ඉදි කිරීමේ දී ද පැරණි ක්‍රමයට වඩා වෙනස් ක්‍රම ඔවුහු අනුගමනය කරති. බෝධි ප්‍රාකාරයට හෝ දානශාලාව ඉදිකිරීමට වැයවන ඇස්තමේන්තුගත මුදල විහාරස්ථානයේ භික්ෂුවගෙන් දැන ගන්නා ව්‍යාපාරිකයා ඒ මුදල චෙක්පතකින් භික්ෂුවට ලබා දෙයි. පසු ව භික්ෂුව විසින් ඒ මුදල් භාවිත කරමින් එය ඉදි කරවනු ලබයි. මෙහි දී භික්ෂුව කොන්ත්‍රාත්කරුවෙකු බවට පත් ව ඇත. ඒ තුළ ද දිස් වන්නේ ව්‍යාපාරික ලක්ෂණයෝ පෙරට ඒම ය. එයින් 'ගෙන් ගෙට ගොස්' සම්මාදම් කොට මෙකී දෑ ඉදි කිරීමේ බෞද්ධ සම්ප්‍රදාය අතු ගෑවී යයි. මේ දෑ තනිව ම ඉදි කරන දානපති ව්‍යාපාරිකයා ඔහුගේ නම එහි ප්‍රදර්ශනය කරවයි. එමගින් ජනප්‍රියවන ඔවුන් ඉන් පාර්ලිමේන්තුවට යාම වැනි ලෞකික අරමුණු අපේක්ෂා කරති. බුදු දහමින් එතෙක් දේශනා කළ ලෝකෝත්තර තත්වයෙන් මිදී එය ලෞකික ධර්මයන් ලෙස හසුරුවන අන්දම ජනාකීර්ණ ස්ථානවල බුදු පිළිම, පන්සල්, නවාතැන් ශාලා ඉදි කිරීම, භික්ෂුව දේශපාලනයට පිවිසීම වැනි ඉහත දැක්වූ කරුනු තුළින් පැහැදිලි වේ.

එලෙස ම ලාංකික මධ්‍යම පංතික නිවෙස්වල 'බුදු ගෙය' පිළිබඳ අදහස් ඇති වීම ද මේ මතවාදී වෙනසේ ප්‍රතිඵලයකි. පැරණි සම්ප්‍රදාය යටතේ බුදුන්ගේ හෝ සීවලී මහරහතන් වහන්සේගේ පින්තූරයක් නිවෙස්වල දැකිය හැකි වුවත් මේ වෙනසත් සමග මධ්‍යම පාංතික නිවෙස්වලට 'බුදුගෙය' අනිවාර්ය අංගයක් විය. ඒ මධ්‍යම පාංතික සාමාජිකයෝ බුදුගෙවල්වලට මල්, පහන්, සුවඳ දුම් දෑ පූජා කොට තම ලෞකික අරමුණු මුදුන්පත් කර ගැනීමට වැර වැඩූහ. නමුත් ලාංකික ගැමියා (සිංහල බුද්ධාගම තුළ) තම ලෞකික අරමුණ ඉටු කර දීමට බුදුන්ට නො හැකිබව දත් නිසා ඒ හා සම්බන්ධයෙන් බාරහාර වූයේ, මල් පහන්, සුවඳ දුම් පූජා කලේ දෙවියන්ට සහ යකුන්ට ය.[6] නමුත් ඇති වූ නව වෙනස්කම් යටතේ නාගරික මධ්‍යම පාංතික කොටස් කෙලින් ම බුදු පිළිමයකට වැඳ ලෞකික ජීවිතය සැපවත් කර ගැනීම සඳහා උපකාර ඉල්ලීම දක්නට ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පිරිත් පිංකම වැනි වත් පිළිවෙත් වල සිට බෝධි පූජාව වෙත මාරුවීම ද දැක්විය හැක. මේ අනුව පෙනී යන්නේ ලෝකෝත්තර ධර්මයක් වූ ථෙරවාදී බුදු දහම ලෞකික ධර්මයක් ලෙසින් හැසිරවීමට ජනයා පෙළඹී ඇති බවයි.

---

(6) සිංහල බුද්ධාගම ගැන තොරතුරු සඳහා කියවිය හැකි ලිපියකි. අමරසේකර, දයා - **ශ්‍රී ලංකා සමාජය තුළ ආගමේ කාර්යභාරය: ශ්‍රී ලංකා සමාජය: සමාජවිද්‍යාත්මක විමසුමක්**. ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ. 1993 සැප්. (පිටු 104-116)

ඇති බවයි. මේ නව සමාජ වෙනස තව දුරටත් අවබෝධ කර ගැනීමට කතරගම දේව ඇදහිල්ල පිළිබඳ ගනනාථ ඔබේසේකර දක්වන දත්ත වැදගත් වේ. මේ වෙනස ඇති වීමට පෙර නාථ, විෂ්ණු වැනි දෙවියන්ට කළ පුද සත්කාර කතරගම දෙවියන්ට කිරීමට මිනිසුන් ඉදිරිපත් වී ඇත. මේ හා සම්බන්ධ ව ඔබේසේකර කළ අධ්‍යයනය අනුව කතරගම දෙවියන්ගේ පිහිට පතා ගිය සාමාජික සංඛ්‍යාව පත්තිනි හා විෂ්ණු දෙවියන්ගේ පිහිට පතා ගිය සාමාජික සංඛ්‍යාවට වඩා හය ගුණයකටත් වඩා වැඩි ය. එහි දී ඔබේසේකරයන් හඳුනාගත් සුවිශේෂ ලක්ෂණය වන්නේ නාථ දෙවියන් වෙත කිසි දු සාමාජිකයෙකු යොමු වී නැති බව යි. ලෝකෝත්තර තත්වයට වැඩි වසයෙන් නැඹුරු නාථ දෙවියන් වෙත කිසිදු සාමාජිකයෙකු ගොස් නො තිබීමෙන් හා කතරගම දෙවියන් සුවිශාල වසයෙන් පෙරට ඒමෙන් පෙනී යන්නේ ආගම තුළින් ලෞකික අරමුණු ඉටු කර ගැනීමට බෞද්ධ සාමාජිකයන් පෙළඹී ඇති බව යි. මෙය යුරෝපයේ සාම්ප්‍රදායික ක්‍රිස්තියානි ආගම බිඳ දමා ප්‍රොතෙස්තන්ත ආගම ඉස්මතුවීම තුළ පෙන්නුම් කළ මානව චර්යා රටාවට සමාන තත්වයකි. එමෙන් ම යුරෝපීය ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය ගැන සලකා බැලීමේ දී දැකිය හැකි කරුණු ඒ හා සමානව ම ලාංකික බෞද්ධ ප්‍රබෝධය තුළ ද දැක ගත හැක. එවක යුරෝපීය ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරයේ මූලිකත්වය ගනු ලැබුවේ මධ්‍යම පංතික අලුතෙන් නැගී ආ උගත් නාගරික කේන්ද්‍රවල සාමාජිකයන් ය. එහි දී මූලිකත්වය ගත් විටන්බර්ග් දේවස්ථානය ද නාගරික දේවස්ථානයක් වූවා මෙන් ම ලාංකික බෞද්ධ ප්‍රබෝධය තුළ ද මූලිකත්වය ගෙන ක්‍රියා කරනු දැකිය හැකි වූයේ නාගරික පන්සල් හා එහි ස්වාමින් වහන්සේලා ය. එලෙස ම යුරෝපීය ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරයට නායකත්වය දුන් මාටින් ලූතර්, ජෝන් කැල්වින්, බෙන්ජමින් ෆැන්ක්ලින්, රිචර්ඩ් බැක්ස්වර්නර් යනාදීන් ක්‍රිස්තියානි භක්තිකයන් වීය. ඔවුන් තම ක්‍රිස්තියානි ආගමේ ක්‍රියාකලාපයට විරුද්ධ ව නැගී සිටින ලදී. මේ අන්දමින් ලංකාවේ බෞද්ධ ප්‍රබෝදය සඳහා මූලික නායකත්වය සපයනු ලැබූ ඕල්කට්තුමා සමග ම අනගාරික ධර්මපාලතුමා ප්‍රමුඛ පිරිස ක්‍රිස්තියානි භක්තිකයන් විය. ඉංග්‍රීසි භාෂාවෙන් උගත් මධ්‍යම පාංතික මිෂනාරී සමාජ පසුබිමක් ඇති ධර්මපාලතුමා ඒ පසු බිමට විරුද්ධ ව නැගී සිටින ලදී, මාර්ටින් ලූතර් සාම්ප්‍රදායික ක්‍රිස්තියානි ආගමට විරුද්ධව ප්‍රත්‍ය 95 ක් ඉදිරිපත් කළා සේ ම අනගාරික ධර්මපාලතුමා විසින් ද බෞද්ධයන් සඳහා නව ආචාරධර්ම පද්ධතියක් ද හඳුන්වා දී ඇත. මුල් කාලයේ දෙන් ඩේවිඩ්



Scanned with CamScanner

හේවාවිතාරණ' නමින් හඳුන්වනු ලැබූ ඔහු ඉංග්‍රීසි ක්‍රමයට සකස් වූ ඒ නාමය වෙනුවට 'ධර්මපාල හේවාවිතාරණ' නමින් තමා හැඳින්විය. පසු ව ඔහුට අවු:22 ක් වූ විට දී බඹසර දහම් පිරීම හෙවත් 'අනගාරික' තත්වයට පත්විය. හේ තම අනගාරික නාමයට ගැළපෙන කහ පැහැති ඇඳුමකින් සැරසී සිටින ලදී. මේ තත්වය තුළ අනගාරික ධර්මපාලතුමා ප්‍රොතෙස්තන්ත පූජකවරයෙකු ලෙසින් පෙනී සිට ඇත.

මේ බෞද්ධ ව්‍යාපාරය තුළ ධර්මපාලතුමාගේ කාර්යභාරය කෙතෙක් වැදගත් වූවා ද යන්න ඔහු සිහි කිරීමට විශේෂ දිනයක් වෙන් කිරීමෙන් හා ඔහුගේ අනුරූ ඉදි කිරීමට සිංහල බෞද්ධයා පෙළඹීමෙන් ද පෙනී යයි. යුරෝපයේ දේශපාලන හා සමාජයීය වෙනසක් සිදු වීමට කැල්වින්වාදය, ලූතර්වාදය බල පෑ ආකාරයට ම ලංකාවේ දී ධර්මපාලතුමාගේ ව්‍යාපාර බෙහෙවින් බලපා ඇත. කෙසේ වුවත් ධර්මපාලතුමා උනන්දු වී ඇත්තේ නැගී එන සිංහල ප්‍රභූ පන්තිය සඳහා ආරක්ෂාව සැලසීමට යයි ඔබේසේකර දකී. ඒ අනුව අනගාරික ධර්මපාලතුමා නවීකරණය වූ ථෙරවාදී බුදු දහමේ සංකේතයක් ලෙස පෙනී සිටි බව ද ඔබේසේකරයන් සඳහන් කරයි.

ධර්මපාලතුමාගේ ක්‍රියාකලාපය තුළ එක් අතකින් ඔහු බටහිර සිරිත් විරිත් ප්‍රතික්ෂේප කරමින් අනෙක් අතින් බටහිර සිරිත් විරිත් අගය කළ බව ද පෙනී යයි. ගොවි සංවිධාන ප්‍රතික්ෂේප කරමින් වෙළඳ ව්‍යාපාර, වෙළඳ සංගම් පැසසුමට ලක් කරන ලදී. පේෂ කර්මාන්තය, පිහන් කර්මාන්තය, චිත්‍ර ශිල්පය ගිනිකූරු කර්මාන්තය. සුවඳ විලවුන් කර්මාන්තය වැනි කර්මාන්ත ක්ෂේත්‍රවල ශික්ෂණයක් ලැබීම සඳහා ලාංකිකයන් බටහිර රටවලට යැවීම මේ සඳහා නිදසුන් ලෙස පෙන්වා දිය හැක. මේ අනුව ගනනාථ ඔබේසේකර පවසන්නේ අනගාරික ධර්මපාලතුමා ඉදිරිපත් කළ ආචාර ධර්ම පද්ධතිය තුළින් ප්‍රකාශ වන්නේ 'හැන්ද හා ගැරුප්පුව නියම අන්දමින් පාවිච්චි කරන්නේ කෙසේ ද' යන්න යි. මේ අනුව ධර්මපාලතුමා ගෙන ගිය බෞද්ධ ආගමික ව්‍යාපාරය තුළ කැපී පෙනේනනේ සිංහල බෞද්ධයන් අතුරින් ඒ වන විට ශීඝ්‍ර වසයෙන් බිහි නො වූ ප්‍රභූන් උදෙසා හා ඔවුන්ගේ ආරක්ෂාව උදෙසා සාමාජයීය ව්‍යුහයක් සකස් කර දීමට උනන්දු වී ඇති බව යි. ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස 'ප්‍රොතෙස්තන්ත බුදුදහම' නමින් සංකල්පයක් සාකච්ඡාවට ලක් කළ හැකි වේ.



Scanned with CamScanner

## ආශ්‍රිත ග්‍රන්ථ


(1) De. Silva, K. M. D. - ***Religion and the state in the early nineteenth century, History of ceylon.*** University of ceylon, colombo 1973 vol 3 (pp 66-76).

(2) Malalgoda, Kitsiri - ***Buddhism in Sinhalese Society, 1750-1900***

University of Californiya press, Berkely, 1976 (p 109).

(3) Obeysekara, Gananatha- ***The Great Tradition and little Tradition in Perspective of the Sinhala Buddhism; Asian Studies,*** vol 12 1958.

(4) Weber, Max - ***The Protestant Ethic and the spirit of capitalism,***

(Translated by Talcott parsons) Charles scribner's Sons.

Newyork, 1958.

(5) සෝමරත්න ජී. පී. වී. - **කිතුනු සසුනේ ඉතිහාසය,**

(ආරම්භයේ සිට ලූතර් දක්වා)
ප්‍රථම මුද්‍රණය 1988,
පරි: 18 (පිටුව 121-125).

(6) සෝමරත්න, ජී. ජී. වී. - **ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය,**
ඉතිහාස හා දේශපාලන විද්‍යා අංශය
කොළඹ විශ්වවිද්‍යාලය, 1991
(පිටුව 215-238).




Scanned with CamScanner

# 07

# විවාහක කාන්තාවන්ගේ ජාත්‍යන්තර සංක්‍රමණ හා පවුල් සංස්ථාවේ ගැටලු*

ලංකාවට 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීම හේතුවෙන් නිදහස් වෙළෙඳ කලාපයෙහි, සංචාරක ව්‍යාපාරයෙහි රැකියා අවස්ථා වැඩිවීම සහ ගෘහ සේවිකාවන් ලෙස කාන්තාවන් විශාල ප්‍රමාණයක් රැකියා සොයා, බටහිර ආසියාවට යෑම පැහැදිලි ව දැක ගත හැකි විය. බටහිර ආසියාවට රැකියා සොයා යන විවාහක කාන්තාවන්ගේ සංක්‍රමණය, ඔවුන්ගේ පවුල් සංස්ථාව තුළ කුමන අන්දමේ ගැටලු නිර්මාණය කොට ඇද්ද යන්න විමසීම අධ්‍යයනයෙහි අරමුණ වේ.

'සංක්‍රමණය' යන්න මානව සමාජ සංවිධානයෙන් වෙන් කළ නො හැකි, මිනිසා ශිෂ්ටාචාරගත වීම ආරම්භ කළ අවධිය දක්වා ම දිව යන්නකි. මානවයාගේ මේ සංක්‍රමණ, ශිෂ්ටාචාර ගොඩ නැඟීමට මෙන් ම, බිඳ වැටීමට ද පාදක වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. ජන සංක්‍රමණ තුළින් සමාජයීය හා ආර්ථික වෙනස්කම් රැසක් ඇති විය හැකි බව ඉන් ප්‍රකට වේ. මෙවැනි සංක්‍රමණික රටා ස්වරූප දෙකක් යටතේ අධ්‍යයනය කළ හැකි ය.

(අ) අභ්‍යන්තර සංක්‍රමණය (Internal migration)
(ආ) ජාත්‍යන්තර සංක්‍රමණය (International migration)

අභ්‍යන්තර සංක්‍රමණය යනු යම් කිසි රාජ්‍යක නැතහොත් සමාජ ක්‍රමයක් තුළ එහි සීමාවන්හි සිදු වන මිනිස් සංචලනය යි. මේ අභ්‍යන්තර

* ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන බදුන්ගොඩ ග්‍රාමයෙහි කළ ප්‍රත්‍යෙයික අධ්‍යයනයක් ඇසුරෙන් මේ ලිපිය සකස් කරන ලදී. පර්යේෂණ කාර්යය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණී 'එන්. වී. ජී. දීපා ස්වර්ණ කුමාරි' මෙනවිය ද සහාය වූනි.



Scanned with CamScanner

සංක්‍රමණය ජනගහණ ප්‍රතිව්‍යාප්තියටත්, එමගින් නාගරීකරණයටත් බලපාන බව පෙනී ගොස් ඇත. ජාත්‍යන්තර සංක්‍රමණය යනු යම් කිසි රාජ්‍යක සීමාවන් ඉක්මවමින් සිදු වන මානව සංචලනය යි. මේ ජාත්‍යන්තර සංක්‍රමණය එහි ස්වභාවය මත ස්වරූප දෙකකින් පෙනී සිටී. එනම් පුහුණු ශ්‍රමිකයන්ගේ ජාත්‍යන්තර සංක්‍රමණය හා නුපුහුණු ශ්‍රමිකයන්ගේ ජාත්‍යාන්තර සංක්‍රමණය වසයෙනි. 'බුද්ධි ගලනය' (Brain drain) නමින් හඳුන්වන පුහුණු ශ්‍රමිකයන්ගේ ජාත්‍යන්තර සංක්‍රමණයට වෘත්තීය නිපුණතාවයක් හෝ ඉහළ අධ්‍යාපන සුදුසුකම් සාක්ෂාත් කර ගත්තවුන්ගේ සංචලන සැලකේ. මෙවැනි වෘත්තිය නිපුණතාවයක් හෝ ඉහළ අධ්‍යාපනයක් නො ලැබූවන්ගේ සංක්‍රමණය නුපුහුණු ශ්‍රමිකයන්ගේ සංක්‍රමණය නම් වේ.

ඓතිහාසික වසයෙන් පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ විශාල වසයෙන් කැපී පෙනෙන සංක්‍රමණය වන්නේ අසූ වැනි දශකයේ පටන් බටහිර ආසියාවට නැතහොත් මැද පෙරදිග තෙල් සම්පතින් පොහොසත් රටවල් කරා ඇදී ගිය නුපුහුණු ශ්‍රම සංචලනය යි. මැද පෙරදිග රටවල සේවයේ නියුක්ත මෙකී නුපුහුණු ශ්‍රමිකයන්ගේ ඉතිරි කිරීම් රටෙහි විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මාධ්‍යයක් වූ නිසා මේ ජාත්‍යන්තර නුපුහුණු ශ්‍රම සංක්‍රමණයට රාජ්‍ය අනුග්‍රහය ද ලැබුණි. මෙයට අමතර ව වාර්ෂික ව ගෘහසේවය සඳහා බටහිර ආසියාවට යන 50,000 ක් පමණ වන ලාංකිකයන් වාර්ෂිකව රටෙහි ශ්‍රම බලකායට එකතු වන 150,000 ක් වන රැකියා විරහිතවූවන්ගේ කොටසක් වීම ද මීට රාජ්‍ය අනුග්‍රහය ලැබීමට හේතුවයි. එලෙස ම 1979 සිට තෙල් මිළ ඉහළ යාම නිසා සෑම මට්ටමක ම ශ්‍රමය සඳහා තෙල් රටවලින් ඉල්ලුමක් ඇති විය. එමෙන් ම ඒ රටවල සංස්කෘතික පරිසරය තුළ රැකියාවන්ට කාන්තා ශ්‍රමිකයන්ගේ අඩු සහභාගිත්වයත්, අප රටවලින් ගෙන්වා ගන්නා ශ්‍රමයට ඔවුන්ගේ රටවලට සාපේක්ෂව ගෙවිය යුතු අඩු වැටුපත් නිසා ලාංකික වනිතාවන්ට වැඩි වැඩියෙන් මැද පෙරදිග රැකියා අවස්ථා උදා වුණි. අනෙක් අතට ලාංකික සාමාජිකාවන් ද මේ සංක්‍රමණයට විශේෂ ඇල්මක් දැක්වීමට හේතු වූයේ එතෙක් රටෙහි පැවැති අර්ථ ක්‍රමය යටතේ කාන්තා රැකියා ඉඩ ප්‍රස්ථා දුලබ වීමත්, රැකියාමය වසයෙන් ඔවුන්ගේ අගය අඩුවෙන් පිළිගෙන තිබීමත් සහ ලංකාවේ යම් රැකයාවක නියුක්ත කාන්තාවකට මෙරටේ දී ලැබෙන වැටුපට වඩා සිත් ගන්නා ඉහළ වැටුපක් ලැබීමත් හා ඉන් වැඩිප්‍රමාණයක් ඉතිරි කර තම පවුලේ සාමාජිකයන්ට එවීමට හැකිවීමත් ය. මේ නිසා ඉහළ ජීවන තත්වයක් අපේක්ෂා වෙන් රටින් පිට වූ සංක්‍රමණිකයන්ගෙන් 81% ක් බටහිර



Scanned with CamScanner

ආසියාවට සංක්‍රමණය වූ බව වාර්තා වන අතර, ඉන් 52.5% ක් කාන්තාවෝ වෙති. එනම් 1981 දී රැකියාවන් සඳහා සංක්‍රමණය වූ 57447 දෙනාගෙන් 30160ක් කාන්තාවන් වී ඇත. මෙලෙස සංක්‍රමණය වූ කාන්තාවන්ගෙන් ද 64.4% ක් විවාහ වී සිටි බව ද වාර්තා වේ. මේ අනුව ජාත්‍යන්තර සංක්‍රමණය සඳහා යොමු වන නුපුහුණු ශ්‍රමිකයන්ගෙන් විශාල ප්‍රමාණයක් කාන්තාවන් බව ද, එමෙන් ම ඔවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් විවාහක කාන්තාවන් බවද පෙනී යයි.

ප්‍රථමයෙන් ම විවාහක කාන්තාවක් විදේශ ගත වූ පවුල් සංස්ථාවක් සැලකූ කල, ඇයගේ ස්වාමියා ජීවත් ව සිටී නම් ඔහු ද ඇගේ දරුවන් ද ලාංකික පරිසරය තුළ හුදකලා වන බව පෙනී යයි. පවුලක 'මව' යනු ඒ පවුල් සංස්ථාවේ න්‍යෂ්ටිය හා සක්‍රිය බලවේගය යි. ඇය පවුල් සංස්ථාවෙන් ඉවත්වීම නිසා 'බිඳුනු පවුලක්' (Broken Family) නිර්මාණය වීමට අවශ්‍ය පසුබිම සැකසේ. මේ බිඳුනු පවුල් යන්න ද ආකාර දෙකකින් පෙනී සිටි. එනම්, මානසිකව බිඳුනු පවුල් (Psyclologically Broken Families) හා සමාජයීය වසයෙන් බිඳුනු පවුල් (Socially Broken Families) යනුවෙනි. මව පවුල් සංස්ථාව තුළින් ඉවත් වීමත් සමඟ මෙවැනි පවුල් අනිවාර්යයෙන් ම සමාජයීය වසයෙන් බිඳුනු පවුලක තත්වයට ඇද වැටේ. එමෙන් ම සමාජයීය වසයෙන් පවුල් සංස්ථාව බිඳී යාමත් සමඟ දරුවන් හා පියා හුදකලා වීමක්, ඒ තුළ ඔවුන්ගේ ආකල්පයන්ට අනුව ඒ පවුල මානසික වසයෙන් ද බිඳ යන බව පෙනි යයි. මේ අනුව මේ පවුල් සමාජයීය වසයෙන් සහ මානසික වසයෙන් ද බිඳී ඇත.

මේ ආකාරයෙන් පවුල් ඒකකය බිඳී යාම තුළ මෙවැනි පවුල් වල පියාගේ වෘත්තිය සහ ගෘහීය කාර්යභාරයට අමතර ව මවගේ ගෘහීය කාර්යභාරය ද පියා විසින් ම දැරිය යුතු වේ. මෙයින් මව, පියා යන තත්වයන් දෙකට ම අයත් කාර්යභාරයක් පිය මත පැටවී තිබේ. මෙය පියාට අධිකාර්යභාරයක් ආරෝපණය කිරීමකි. මේ තත්වය තුළ පියා නිදහසක් නොමැති, අසහනකාරී අයෙකු බවට පත් වේ. මේ නිසා බොහෝ පියවරුන් තම අසහනකාරී ජීවිතයට සහනයක් සොයා ගැනීමට විවිධ දිශානතීන්ට යොමු වී ඇත. ඒ දිශානතින් අතර ජනප්‍රිය මාධ්‍යය මත්ද්‍රව්‍ය වී ඇත. මත් ද්‍රව්‍ය නො ගත්තෙකු නම්, ඊට ඇබ්බැහි වීම ද, මත් ද්‍රව්‍ය භාවිත කළ අයෙකු නම්, එයට දැඩි ලෙස වහල් වීම ද දැක ගත හැක. පියාගේ මත් ද්‍රව්‍ය භාවිතය නිසා පවුලේ දරුවන් තව දුරටත් අසරණ වන අතර දිනපතා බීමත් ව එන පියා දරුවන් කෙරෙහි සැලකිල්ලක් නො දක්වයි. එයින් මේ දරුවන්ට මවගේ හා පියාගේ යන

දෙදෙනාගේ ම ආදරය, සැලකිල්ල නො ලැබී යයි. එලෙස ම කීමත් පියවරුන් අතින් ගැහැණු දරුවන්ට විවිධ ලිංගික අතවර හා දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ අවස්ථා ගැන ද නිරීක්ෂණය කළ හැකි විය. මේ අනුව පවුලේ ස්ථාවරත්වය සුරක්ෂිත, දරුවන් හා දෙමාපියන් අතර සුහද ලෙන්ගතු සම්බන්ධතාවය මේ පවුල්වල විනාශ වී ගොස් ඇත.

මේ සමහර පවුල් වල දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අඩාල වී ඇති අයුරු ද, පාසල් යන ළමයින් ගත හොත් ඔවුන්ගේ පැමිණීම දුර්වල බව ද තවදුරටත් නිරීක්ෂණය කළ හැකි විය. එවැනි බොහෝ පවුල්වල වැඩිමල් දියණියගේ පාසල් ගමන අඩාල වී හෝ පැමිණීම දුර්වල ව පැවැතුණි. ඊට හේතුව මව විසින් දරුවන් වෙනුවෙන් ඉටු කළ කාර්යභාරය, තම සහෝදර සහෝදරියන් වෙනුවෙන් ඉටු කිරීමට වැඩිමහල් දියණිය වෙත පැවරී තිබීම ය. මේ අනුව පවුල තුළ දෙවැනි මවක සේ වැඩිමල් දියණිය කටයුතු කරන්නී ය. වයසින් මෝරා යෑමට පෙර ඔවුනට මවුරුන්ගේ කාර්යභාරයන් බලෙන් පැටවීම නිසා ළදරු මානසිකත්වය විනාශ වී ගොස් ඇති අතර එය ඔවුනගේ සමාජානුයෝජන ක්‍රියාවලියට අහිතකර අන්දමින් බලපෑම් කරයි. ළමයෙකුගේ සමාජානුයෝජනය සාර්ථක වීමට දීර්ග ළමා කාලයක් (Childhood) තිබීම අත්‍යවශ්‍ය සාධකයක් බව බොහෝ දෙනාගේ පිළිගැනීම යි. ඉහත පසුබිම තුළ ඒ දියණියන්ගේ ළමා කාලය විනාශ කර දමා ඒ වෙනුවට වැඩිහිටි කාර්යභාරයක් ආරෝපණය කර ඇත. ඒ අනුව බලෙන් වැඩිමහල් කරන ලද දරුවන් මේ පවුල් පරිසරය තුළින් නිර්මාණය වේ. සෑම දෙයක් ම ක්ෂණිකව (Instant) කරන වාණිජමය සමාජ රටාවක් තුළ එය මිනිස් ජීවිතය වෙත ද ආරෝපණය වී ඇති බව මින් ප්‍රත්‍යක්ෂ වේ.

අප සංස්කෘතියට අනුව පවුලක ගැහැණු දරුවෙකුට සමීපතම මිතුරිය වන්නේ ඇයගේ මවයි. නමුත් මව විදේශගත වූ පවුලක දියණියන්ට ඒ සමීපතම මිතුරිය අහිමි වීමෙන් ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න ඉදිරිපත් කිරීමට අයෙකු නැත. එලෙස ම දියණියකට සමාජ සාරධර්මයන්ට අවනත ව සමාජය තුළ ගමන් කළ යුතු දිශාව බොහෝ විට පෙන්වනු ලබන්නේ ද මවයි. මේ නිසා කුඩා ගැහැණු දරුවකුගේ පරමාදර්ශී (Ideal) චරිතය වන්නේ ද ඇයගේ මවයි. නමුත් මවගේ විදේශගත වීම තුළ මව හා දරුවා අතර හිඩැසක් නිර්මාණය වී ඇති අයුරු ද, එය සුවිශේෂ ආකාරයෙන් ගැහැනු දරුවන් කෙරෙහි බලපාන බව ද පෙනී යයි.

Scanned with CamScanner

පුද්ගලයෙකු උපත ලද විට ඔහු මුලින් ම සම්බන්ධ වන සමාජයීය ආයතනය පවුල් සංස්ථාව යි. එය පුද්ගල පෞරුෂය සැකසීමේ තීරණාත්මක කාරකයක් ලෙසින් ක්‍රියා කරන බව අප දනිමු. නමුත් බිඳුණු පවුල් පරිසරයක් තුළ නිසි සමාජානුයෝජන ක්‍රියාකාරීත්වය අඩුවී යන අතර ඒ තුළින් 'අපරාධ ජනක පවුල්' (Criminojenic families) නිර්මාණය වේ යැයි තර්ක කළ හැක. මේ අපරාධජනක පවුල් බිහිවීම ස්ථාවර කිරීම සඳහා මව විදේශගත වූ පවුල්වල සුවිශේෂ පවුල් පරිසරය හේතු වේ. ඒ පරිසරය හේතු කොට ගෙන දරුවන් තුළ 'දෙමාපියන් තමන් කෙරෙහි සැලකිල්ලක් දක්වන්නේ නැත' යන ආකල්පය පහළ වේ. මේ ආකල්පය නිසා දරුවන් හා දෙමාපියන් අතර සුහද ලෙන්ගතු සම්බන්ධතාවයක් නැත. එබැවින් මෙවැනි පවුල්වල දරුවන් අපචාරීන් වීම කෙරෙහි යොමු කරවන සම්භාවිතාවය වැඩිය. හාට්ෂෝන් හා මාර්ක් (Hartshorne and Marke) කළ පර්යේෂණයකට අනුව දෙමාපියන් හා ළමුන් අතර සහසම්බන්ධතාවය අඩු නම්, ළමුන් අපචාරීන් වීමේ සම්භාවිතාවය වැඩිබව ද, ඒ සම්බන්ධතාවය වැඩි නම්, එවැනි අහිතකර ප්‍රතිඵලවල බලපෑම අඩු බව ද අධ්‍යයනය කර ඇත. මෙයින් ද සනාථ වන්නේ මව විදේශගත වූ පවුලක දරුවන් සහ දෙමාපියන් අතර සම්බන්ධතාවය අඩු නිසා අපරාධජනක පවුල් බිහිවීමට ඇති ඉඩකඩ වැඩි බව යි.

මිනිසාගේ ලිංගික ජීවිතය සැලකුව හොත් ඔහු අවුරුද්ද පුරා ම ක්‍රියාකාරී ලිංගික සත්වයෙකි. මේ හේතුවෙන් මෙවැනි පවුල්වල බොහෝ පියවරුන් තම ලිංගික උවමනාවන් සපුරා ගැනීම සඳහා ගණිකාවන් වෙත යොමු වන අයුරු සහ වෙනත් ක්‍රම වෙත ද ප්‍රවේශ වන අන්දම ද නිරීක්ෂණය කළ හැකි විය. මෙවැනි පියවරුන්ගේ නො මනා හැසිරීම් ගැන දන්නා සමහර දරුවන් තුළ පියා කෙරෙහි ගෞරවයක් හා අවනත භාවයක් නැත. ඒ තුළ පවුල් ඒකකයේ නිසි පාලනයක් හා නිසි ආධිපත්‍යයක් ගෙන යාමේ හැකියාව පියා කෙරෙන් ගිලිහී යයි. මේ තත්වය නිසා පවුල් ඒකකය යම් අරමුණක ස්ථාවර ලෙස රඳවා තබා ගැනීමේ හැකියාව නැතිවී යන අතර පාලනයකින් තොර නො මේරූ දරුවන් සීසීකඩ විසිරී යයි.

විදේශගත ගෘහසේවිකාවන් කෙරෙහි ලාංකික සමාජයෙහි බොහෝ සාමාජිකයෝ අසුභවාදී දෘෂ්ටිකෝණයකින් බලති. සමාජ



Scanned with CamScanner

සම්මත නො වූ නොයෙක් ක්‍රමයන්හි නිරත වී මුදල් උපයා ගෙන ඔවුන් තම රටට පැමිණේ යැයි ලාංකික සමාජිකයන් තුළ ආකල්පයක් ඇත. මේ ආකල්පය ද දරුවන් කෙරෙහි අහිතකර ප්‍රතිඵල ඇති කිරීමට බලපායි. මේ අනුව මව විදේශගත වූ පවුලක දරුවෙකුට ඔහුගේ මව 'නොහොබිනා රැකියාවකට' ගොස් ඇති බවට සමාජයෙන් ලේබල් කර, දරුවා තුළට අභ්‍යන්තරීකරණය කරයි. මේ සමාජ ලේබල්කරණය නිසා මව කෙරෙහි තරහක්, කෝපයක්, පිළිකුලක් ඇති කර ගනිමින් ඇයට ඇති ගෞරවය දරුවා ඇයගෙන් ඉවත් කර ගනී. මෙයින් සිදු වන්නේ යම් දිනෙක මව විදේශයක සිට සිය පවුල් ඒකකයට නැවත පැමිණිය ද, ඒ වන විට දරුවන් ඇය කෙරෙහි තිබූ ගෞරවය සැලකිල්ල, ඉවත් කර ගෙන තිබීම යි. මේ හේතු කොට ගෙන පවත්නා සමාජ ක්‍රමය තුළින් නිර්මාණය කර දී ඇති දැඩි ආර්ථික ප්‍රශ්නවලට පිළියමක් ලෙය හෝ තිබෙන ආර්ථික තත්වය වැඩි දියුණු කර ගෙන දරුවන්ට සාර්ථක අනාගතයක් නිර්මාණය කර දීමේ අපේක්ෂාවෙන් විදේශගත වූ මව තව දුරටත් අසරණ වීම යි. ඒ අනුව විදේශ රැකියාවක ප්‍රතිලාභ මගින් පවුලේ ස්ථාවරත්වය රැක ගැනීමට විදේශගත වූ කාන්තාවන්ට එය අහිමි වී යන පරිසරයක් නිර්මාණය වන අයුරු දැක ගත හැකි ය. එපමණක් නො ව ඉදිරියට ද එනම්, විදේශයක සිට සිය පවුල් ඒකකයට නැවත පැමිණිය පසු ද තම පවුලේ ස්ථාවරත්වය හා අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අපොහොසත් වේ. විදේශ රැකියාවක නියුක්ත ව පැමිණි කාන්තාවකගේ පවුල් සංස්ථාවට අදාළ වර්තමාන හා අනාගත යන දෙයාකාරයේ ම වූ අරමුණු බිඳී යන අයුරු ඉන් දෘශ්‍යමාන වේ.

මේ අනුව විවාහක කාන්තාවන් විදේශ රැකියාවකට යොමු වීම, ඔවුන්ගේ පවුල් ඒකකය විවිධ දෙදරා යෑම්වලට ලක් කරමින්, එහි සාමාජිකයන් අතරමං කිරීමට වැඩි ඉඩකඩක් සලසන බව නිරීක්ෂණය කරන ලදී. සමාජ ක්‍රමය මගින් නිර්මාණය කර දී ඇති දරිද්‍රතාවයට විරැකියාවට ආර්ථික පීඩනයට පිළියමක් ලෙස දරුවන් සිටින විවාහක කාන්තාවන් විදේශ රැකියාවලට යොමු වීම (යම් කිසි පිරිසක් ඉන් ආර්ථික සුරක්ෂිත බවක් ලබා ගත්ත ද) ඔවුන්ගේ පවුල් සංස්ථාවට බොහෝ අඳුරු ප්‍රතිඵල ලබා දෙන්නක් බව නිගමනය කළ හැක.



Scanned with CamScanner

# ආශ්‍රිත ලේඛණ


(1) ජයවීර, ස්වර්ණා - සංවර්ධන සැලසුම් සඳහා කාන්තාවන් යොදා ගැනීම. **ආර්ථික විමසුම** වෙළුම 11, අංක, 10 1986 ජනවාරි මහජන බැංකු ප්‍රකාශන - කොළඹ. (පිටුව 10-11)

(2) මුණසිංහ, සෝමා පද්මිණී ජයවීර සහ ඩබ්. ඒ. සිරිසේන - **ජන පුවත්**. ජනගහණ තොරතුරු මධ්‍යස්ථානය සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය, කොළඹ, 1992 දෙසැම්බර්.

(3) පින්නවල, මල්ලිකා රාණි - **ජන සංක්‍රමණික රටා. සමාජ විමසුම** අංක 07, 1990/91 කලාපය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (පිටුව 152-157).

(4) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය - **මැදපෙරදිග සංක්‍රමණය.** කොළඹ 1984.

(5) ආසියානු සහ ශාන්තිකර කලාපය සඳහා ආර්ථික හා සමාජයීය කොමිසම - **ii ශ්‍රී ලංකාවේ සංක්‍රමණය. නාගරීකරණ හා සංවර්ධනය.** පරිච්ඡේදය 3 (පිටුව 35-64) 1980.


Scanned with CamScanner

08

# ලංකා සමාජයේ සිය දිවි නසා ගැනීම්

කිසි යම් සමාජ ක්‍රමයක පුද්ගලයෙකු මුහුණ දෙන ගැටලුකාරී තත්වයකට වෙනත් සහනදායී පිළිවෙතක් අනුගමනය කිරීමට නො වේ නම් හෝ එකී සමාජ ක්‍රමය ඒ පුද්ගලයාට ඒ තත්වයෙන් මිදීමට ඉඩ ප්‍රස්තාව, අනුබල නො දේ නම්, එවැනි අවස්ථාවක දී යොමු විය හැකි ක්‍රියාවක් ලෙස 'සිය දිවි හානි කර ගැනීම' දැක්විය හැක. මින් ප්‍රකාශ වන්නේ සමාජ ඒකාබද්ධතාවයේ දුර්වල ස්වරූපය සිය දිවි නසා ගැනීම කෙරෙහි බල පාන ප්‍රබල කරුණක් බව යි.

'සිග්මන් ෆ්‍රොයිඩ්' ට (Sigmund Freud, 1856-1939) අනුව සිය දිවි නසා ගැනීම අංශක 180 ක් ආපස්සට හැරී සිදු කරන මිනී මැරීමකි. තමා නැසීමටත් අනෙක් සාමාජිකයෙකුගේ දිවි තොර කිරීමටත් මූලික වන්නේ එක ම භාවමය ස්වභාවයකි. ඒ අනුව කෙනෙකු තවකෙකු කෙරෙහි ඇති විය හැකි ආක්‍රමණකාරී සිතුවිල්ලක් තමා වෙතට ම යොමු කර ගැනීම සිය දිවි නසා ගැනීම ලෙස ඔහු අර්ථ දක්වන අතර එය 'මාරක ඇල්මක්' ලෙසින් ද නම් කර තිබේ.

සිය දිවි හානි කර ගැනීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් කළ ප්‍රංශ සමාජ විද්‍යාඥ එමිල් ඩර්කයිම් (Emile Durkheim 1858-1917) 'ප්‍රතිඵලය (මරණය) ස්ථිර වශයෙන් ම දැනගෙන මරණයට පත් වන පුද්ගලයා විසින් ම යොදා ගත් ප්‍රතිජානාත්මක හෝ නිංශේධනාත්තමක ක්‍රියාවක් මගින් සිදු වන මරණය' වශයෙන් අර්ථ දක්වා තිබේ.

සමාජ ක්‍රමයක් සාම්ප්‍රදායික අඩියරක සිට නූතන කාර්මික සංකීර්ණ ධනවාදී සමාජ අදියරක් දක්වා විකාශනය වීමේ දී සිය දිවි නසා ගැනීම් ප්‍රමාණාත්මක ලෙස ඉහළ ගොස් ඇත. මේ පිළිබඳ යුරෝපීය සමාජ දෙසීයකට අධික ප්‍රමාණයක් අධ්‍යයනය කරමින් සිය දිවි නසා ගැනීමට මූලික වන්නා වූ හේතු මුල් කර ගනිමින් ඩර්කයිම් විශ්වීය වර්ගීකරණයක් සකසා ඇත. එනම් :

Scanned with CamScanner

01. ආත්මීය හෙවත් මමායනික සිය දිවි නසා ගැනීම
(Egoistic Suicide)
02. පරහිතකාමී සිය දිවි නසා ගැනීම
(Altruistic Suicide)
03. අනෝමීය සිය දිවි නසා ගැනීම
(Anomic Suicide)

සාම්ප්‍රදායික සමාජ නූතන සංකීර්ණ තත්වය දක්වා විකාසනය වීමේදී පුද්ගලයා තමාගේ අපේක්ෂා සමාජමය අන්ත (පොදු දිශානතිය) කරා යොමු කිරීම අත හැර පුද්ගල අන්ත (පෞද්ගලික දිශානතිය) කරා යොමු කිරීම කරනු ලබයි. ඒ හේතුවෙන් පුද්ගලයා ස්වකීය පුද්ගලික අරමුණු ලබා ගැනීමට අඛණ්ඩ තරඟයක නිරත ව සිටී. මේ නිසා පුද්ගලයා තමාගෙන් සමාජයට ඉටු වියයුතු දේවල් ගැන තව දුරටත් නො වෙහෙසෙන අතර සමාජයෙන් තමාට ලැබිය යුතු දේවල් පිළිබඳ ව අපේක්ෂා ගොඩ නගා ගනී. මේ තත්වය යටතේ පුද්ගලයා කෙරෙන් අන්‍යෝන්‍ය සමාජ සම්බන්ධතා, සාමූහික සමාජ ජීවිතය, ප්‍රමුඛ කර ගත් සාමූහික සවිඥානය ඇත් වන අතර බොහෝ දුරට ඔහු න්‍යෂ්ටික පවුල (Nuclear Family) වටා පමණක් ගොණු වූ හුදකලා ජීවිතයක් ගත කරනු ලැබේ. මේ නිසා නූතන සංකීර්ණ සමාජයේ සමාජිකයන්ගේ අන්තර් සම්බන්ධතාවල ප්‍රමාණය පටු වී ඇති අතර, තිබෙන්නා වූ යම් සීමිත අන්තර් සම්බන්ධතා ප්‍රමාණය ද පවත්නා මුදල් අර්ථ ක්‍රමය නිසා වාණිජමය ස්වරූපයක් ගෙන ඇත. මෙවැනි පසුබිමක් යටතේ පුද්ගලයෙකුට යම් බැරෑරුම් ප්‍රශ්නයක්, ගැටලුවක් මතු වුව හොත් ඔහුට එය නිරවුල් කර ගැනීමට අවකාශ නැත. එවැනි අවස්ථාවක දී ඔහු තෝරා ගන්නා සහනදායී විසඳුම සිය ජීවිතය තොර කර ගැනීම විය හැක. ඒ සිය දිවි නසා ගැනීම් 'ආත්මීය සිය දිවි නසා ගැනීම්' ලෙස ඩර්කයිම් දක්වයි.

කිසි යම් සමාජ ක්‍රමයක පවත්නා දුර්වලතා හේතුවෙන් එකී පාලන තන්ත්‍රය ප්‍රශ්න කිරීමට එහි සමාජිකයා පෙළ ගැසිය හැක. ඒ ප්‍රශ්න කිරීම සාමකාමී හෝ රැඩිකල් ස්වරූපයක් ගත හැක. පවත්නා පාලන තන්ත්‍රයට විරුද්ධ ව රැඩිකල්වාදී සංවිධානාත්මක පෙළ ගැසීමක දී හෝ නැඟී සිටීමක දී ඊට සම්බන්ධ වන සාමාජිකයන් හට වගකීම්, අරමුණු, පරමාර්ථ හා බැඳීම් සමුදයක් තිබේ. ඒවා ආරක්ෂා කිරීමට දිවි හිමියෙන් ඔවුන් බැඳී සිටී. එලෙස ම ඒ බොහෝ සාමාජිකයන් තමන්ගේ වගකීම්, යුතුකම් කණ්ඩනය නො වීමට වග බලා ගනී. තම සංවිධානයේ අරමුණු කරා ළඟා වීමට ස්වකීය ජීවිතය පවා පරිත්‍යාග කිරීමට මොවුන්



Scanned with CamScanner

මැලිකමක් නො දක්වති. ඒ අනුව කිසි යම් පුද්ගලයෙකු සමාජයේ පොදු අවශ්‍යතා මත සිය ජීවිතය නැති කර ගනී ද එය 'පරහිතකාමී සිය දිවි නසා ගැනීමක්' වේ. ඓතිහාසික මූලාශ්‍රයන්හි කියවෙන 'විහාරමහා දේවිය' සිය දිවිපුද කිරීම සමාජ විද්‍යාත්මක ව පරාර්ථකාමී වර්ගීකරණයට ඇතුළත් වේ. එමෙන් ම උතුරේ තරුණයන් අතර පවතින මරාගෙන මැරෙන කල්ලිවල ක්‍රියාදාමයත්, ඒ තරුණයන් තම සතුරන් අතට හසුවූ පසු සයනයිඩ් ගිල දැමීමෙන් ජීවිතය නැති කර ගැනීමත්, තම කණ්ඩායම් ප්‍රතිපත්තීන් රැක ගත යුතු නිසා කරනු ලබන්නකි. එලෙස ම ඉන්දීය සමාජයේ භාර්යාවක ස්වකීය ස්වාමිපුරුෂයාගේ වියෝවෙන් පසු ඔහු දවන දර සෑයටම පැන සියදිවි නසා ගැනීම හෙවත් 'සති පූජාව' නමැති දිවි හානි කර ගැනීමේ ක්‍රමයත්, ජපානයේ සාම්ප්‍රදායික යුධ භටයන් අතර දක්නට ලැබුන යුද්ධයේදී පරාජය වූ විට යටත් නො වී බඩ කපාගෙන මරණයට පත් වීම හෙවත් 'හරා-කිරි' නම් දිවි තොර කර ගැනීමේ මාධ්‍යයත් මීට තවත් නිදසුන් ය. මාක්ස්වාදී දෘෂ්ටි කෝණයෙන් බලන කල ජීවිත පරිත්‍යාග කරන විප්ලවවාදියකුගේ ක්‍රියාව තුළින් දිස්වන්නේ පරහිතකාමීත්වය යි. මෙයට කදිම නිදසුන් ලෙස පසු ගිය වකවානුවේ වූ 'මව්බිම නැත්නම් මරණය' යන අදහස දැක්විය හැක. මේ පරහිතකාමී සිය දිවි නසා ගැනීම්වල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණය ඔවුන් සිය ජීවිතය නැති කර ගන්නේ ඊට ආශාවක් නැති නිසා නො ව තම සංවිධානයේ හෝ සමාජයේ ප්‍රතිපත්තීන් වෙනුවෙන් හෙවත් පරාර්ථ චර්යාවක් ලෙසිනි.

සිය දිවි නසා ගැනීම සමාජමය ප්‍රපංචයක් ලෙස විග්‍රහ කිරීමේ දී අනෝමීය සිය දිවි නසා ගැනීම කෙරෙහි ඩර්කයිම්ගේ විශේෂ අවධානය යොමු වුණි. සමාජයක සිදු වන හදිසි වෙනස් වීමක් හෝ කැළඹීමක් හේතුවෙන් ඇති විය හැකි ප්‍රතිමාන විරහිත භාවය (Norm lessness) හෝ ප්‍රතිමාන, සාරධර්ම සිරිත් විරිත් ආදියෙහි ඇති විය හැකි අවුල් සහගත තත්වය නිසා අනෝමීය සිය දිවි නසා ගැනීම් සිදු වන බව ඩර්කයිම් අවධාරණය කරයි. ඩර්කයිම්ට අනුව කිසි යම් සමාජ ක්‍රමයක් තුළ අනෝමීය තත්වයක් ඇති විය හැකි අවස්ථා කීපයක් තිබේ.

i. සමාජ ව්‍යුහයේ සිදු වන ක්ෂණික වෙනස් වීම්,
ii. හදිසි යුධමය තත්ව, ජාතිවාදී අරගල හෝ මහා පරිමාණයේ ආරවුල්,
iii. ගංවතුර, නියඟය, නාය යාම් වැනි හදිසි ව්‍යසනයන්,
iv. පුද්ගලයෙකු මුහුණ දෙන ක්ෂණික ආර්ථික අවපාතයක් හෝ ක්ෂණික ආර්ථික සෞභාග්‍යයක්,



Scanned with CamScanner

v. පුද්ගලයෙකුගේ සමාජ තත්වයේ සිදු වන ඇදවැටීමක් හෝ ඉහළ යාමක් වසයෙනි.

අනෝමීයත්වය පිළිබඳ වැඩි දුරටත් විග්‍රහ කරන ඩර්කයිම් අනෝමීයත්වයේ ආකාර 3ක් දැකිය හැකි බව ද ප්‍රකාශ කරයි.

එනම්,

i. ලිංගික අනෝමීයත්වය (Sexual Anomy)
ii. වෛවාහික අනෝමීයත්වය (Matrimonial Anomy)
iii. ගෘහීය අනෝමීයත්වය (Domestic Anomy)

ප්‍රකෘති ලෝකය තුළ ඉටු කර ගත නො හැකි අසීමිත හා පාලන විරහිත ලිංගික ආශාව තුළින් අවිවාහක පුද්ගලයන් තුල ලිංගික අනෝමීයත්වය ඇති වේ. එක් සහකරුවෙකුගෙන් හෝ සහකාරියකගෙන් සෑහීමට පත් නො වන්නන් අතර වෛවාහික අනෝමීයත්වය ප්‍රකට වේ. වැන්දඹු සාමාජිකයෙකුට ඇති වන ව්‍යාකූල තත්වය ගෘහීය අනෝමීයත්වය නම් වේ.

සමජිකයෙකු සමාජයට නිසි ලෙස අනුකලනය වී සිටිය හොත් ප්‍රතිමාන සාරධර්ම විරහිත මෙවැනි අනෝමීය තත්වයක දී වුව සිය ජීවිතය හානි කර නො ගෙන සිටී. නමුත් සමාජමය අනුකලනය නිසි අන්දමින් සිදු නොවූවකුට හදිසි පීඩනයන් දරා ගත නො හැකි වේ. එහි දී අනෝමීය සිය දිවි නසා ගැනීම් සමාජය තුළ දිස්විය හැක.

මෙ වර්ගීකරණයෙන් ඉදිරිපත් කෙරෙන සාධක මගින් ඩර්කයිම් විග්‍රහ කිරීමට උත්සාහ කරන්නේ සමාජ ඒකාබද්ධතාවය වැඩි තන්හි සියදිවි නසා ගැනීම් ප්‍රමාණය අඩු බවත්, සමාජ ඒකාබද්ධතාවය අඩු තන්හි සිය දිවි නසා ගැනීම් ප්‍රමාණය වැඩි බවත් ය.

ලාංකිකයන්ගේ සිය දිවි නසා ගැනීමේ රටාව තුළ ඩර්කයිම් ගේ වර්ගීකරණයේ ප්‍රභේද තුනට ම ඇතුළත් වන ලක්ෂණයන් දැකිය හැක. ලෝකයේ වැඩිම සිය දිවි නසා ගැනීමේ අනුපාතයක් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ බව හාවර්ඩ් වෛද්‍ය විද්‍යාලයේ සමාජ වෛද්‍ය ප්‍රධානියා වන ආතර් ක්ලෙන්මන් ගේ ප්‍රමුඛත්වයෙන් 1995 මැයි මාසයේ දී නිකුත් වූ ඒ වෛද්‍ය විද්‍යාලයේ නවතම සමීක්ෂණ වාර්තාවක සඳහන් වේ. ඒ වාර්තාවට අනුව සෑම වසරක ම 10,000 ක් ලාංකිකයෝ සිය ජීවිතය අහිමි කර ගනිති. එනම්, සෑම පැයකට ම එක් ලාංකිකයෙකු බැගින්

දිවි නසා ගන්නා බව යි. (ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 302 වගන්තිය අනුව සියදිවි නසා ගැනීම දඬුවම් ලැබිය හැකි වරදකි. එමෙන්ම එහි 299 වගන්තියට අනුව සියදිව නසා ගැනීමට උදව්දීම හෝ පෙළඹවීම ද දඬුවම් ලැබිය හැකි වරදක් වේ.)

1950-1982 අතර වසර 30 ක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගන්නන් ප්‍රමාණය 522% කින් ඉහළ ගොස් ඇත. ඇත්ත වසයෙන්ම මෙකී ප්‍රමාණය මීට වඩා ඉහළ අගයක් ගත යුතු ව ඇත. ඊට හේතුව සිය දිවි නසා ගැනීම් නිල වසයෙන් සංඛ්‍යාන ගත වී ඇත්තේ දිවි නසා ගන්නන්ගේ ප්‍රමාණයට සාපේක්ෂ ලෙස ඉතා මත් සුළු සංඛ්‍යාවකි. මක් නිසා ද යත්, සිය දිවි නසා ගැනීමෙන් සිදු වන මරණ බොහෝ විට ලේබල් කරනුයේ අනතුරකින් සිදු වූ මරණයක් හෝ ස්වාභාවික මරණයක් යනාදී ලෙසිනි. එබැවින් සිය දිවි නසා ගැනීමෙන් සිදු වන මරණවලින් සැබෑ වසයෙන් දිවි නසා ගැනීමක් ලෙස නිළ ආයතන වෙත වාර්තා වන්නේ මූදේ පාවෙන අයිස් කන්දක උඩට පෙනීමට ඇති කොටසම (Tip of ice berg) සමාන ප්‍රමාණයකි. ඒ අනුව නිල වසයෙන් ලංකාවේ සිය දිවි නසා ගැනීම් ප්‍රමාණය වසරකම 10,000 ක් බව ප්‍රකාශ වී ඇතත් නිසි පරිදි සංඛ්‍යා දත්ත නිල ආයතන වෙත වාර්තා වන්නේ නම්, මේ සංඛ්‍යාව මීට වඩා ඉහළ අගයක් ගනු ඇත.

කිසි යම් සමාජයක සිය දිවි නසා ගැනීම ඉහළ හෝ පහළ අගයක් ගනී ද යන්න නිශ්චය කිරීමට නැත හොත් එය සමාජය තුළ සමාජ ප්‍රශ්නයක් ද යන්න හඳුනා ගැනීමට "රොබර්ට් ජේ. හැවිග් හර්ස්ට්" (Robert J. Havighurst) මිනුම් දණ්ඩක් ඉදිරිපත් කරයි. ඔහුට අනුව යම් සමාජයක ජනගහණයෙන් 10,000කට පහළොස් දෙනෙකු (15) දිවි නසා ගනී නම්, එය ඉහළ අගයකි. ජනගහණයෙන් 100,000 කට පස් දෙනෙකු (05) දිවි නසා ගනී නම්, එය පහළ අගයක් ගනී. නමුත් ලංකාවේ සෑම පැයකට ම එක් අයෙකු දිවි නසා ගැනීමෙන් එය ප්‍රබල සමාජ ප්‍රශ්නයක් ලෙස බල පා ඇති බව පෙනේ.

1981 දී වාර්තා වූ දත්ත අනුව ලංකාව තුළ සිදු වූ සෑම මරණ දහසකට ම 56.8 ක් සිය දිවි නසා ගැනීම් විය. එය මහජන සෞඛ්‍යය සම්බන්ධයෙන් බැරෑරුම් ප්‍රශ්න ද මතු කොට ඇත. ලාංකික සමාජයට දිවි නසා ගැනීමේ ගැටලුව කොතෙක් දුරට බල පා ඇද්ද යන්න 1950-1982 කාලය තුළ එහි වර්ධනය සලකා බැලීමෙන් පෙනේ.



Scanned with CamScanner

## ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම්-1950 සිට 1982 දක්වා

(ජනගහණයෙන් දස ලක්ෂයකට)

| වර්ෂය | 1950 | 1955 | 1960 | 1965 | 1970 | 1975 | 1982 |
|---|---|---|---|---|---|---|---|
| සිය දිවි නසා ගත් ප්‍රමාණය | 64.7 | 69.2 | 96.8 | 136 | 191 | 195.3 | 334 |

මූලාශ්‍රය-"ප්‍රතිමාත" 1993/94 කලාපය
(වගු අංක 01)

සංඛ්‍යාන වගුවට අනුව සිය දිවි නසා ගන්නන්ගේ ප්‍රමාණය 1950 වර්ෂයට වඩා 1982 දී හයගුණයක පමණ වැඩි වීමක් වේ. 1975 දී එය 195.3 සිට 1982 දී 334 දක්වා වර්ධනය වී ඇත. 1975 වර්ෂයට වඩා 1982 දී එය ඉතා ඉහළ අගයක් ගැනීමට හේතුව 1977න් පසු ලංකා සමාජය තුළ සිදු වූ ප්‍රබල සමාජ ආර්ථික හා දේශපාලන වෙනස්කම්වල බල පෑම ය. යම් සමාජයක් තුළ අනෝමීය මාදිලියේ සිය දිවි නසා ගැනීම් ඇතිවීමට බලපාන ඩර්කයිම් දක්වා ඇති කරුණු ගැන අවධානය යොමු කළ විට සමාජ විද්‍යාත්මක ලෙස වැදගත් වන ලංකා සමාජය තුළ වූ ක්ෂණික සමාජ වෙනස් වීම් දෙකක් හඳුනා ගත හැක. ඉන් පළමුව 1833 දී වූ "කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය" වේ. ඒ ප්‍රතිසංස්කරණය තුළින් ස්වභාවික වසයෙන් ධනේශ්වර සමාජ ක්‍රමයකට කිසි සේත් ම සූදානම් නො වූ සමාජ පරිසරයකට ධනවාදී අර්ථ ක්‍රමය බලෙන් රෝපනය කිරීමෙන් අනෝමීය මාදිලියකට අවශ්‍ය පදනම සකස් කරනු ලැබී ය. දෙවනු ව 1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හරහා ඒ පරාධීන ධනේශ්වර ක්‍රමය උසස් ම අන්දමින් ලංකා සමාජය වෙළා ගත්තේ ය. මේ ක්ෂණික සමාජ වෙනස් වීම් හි ප්‍රතිඵලය 1975 හා 1982 වර්ෂවල දිවි නසා ගැනීමේ සංඛ්‍යා සංසන්දනය කිරීමෙන් වටහා ගත හැක.

නූතන ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගන්නන්ගේ ලිංගිකත්වය සලකා බලන කළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම සමාන මට්ටමකින් ඊට දායක ව ඇත. 1975 ට පෙර සංඛ්‍යා ලේඛන පරීක්ෂා කිරීමේ දී ස්ත්‍රීන්ගේ සිය දිවි නසා ගැනීමේ ප්‍රමාණයේ අඩුවක් දැකිය හැක. නමුත් 1975 න් පසු ඔවුන් ද පුරුෂයන් හා සම ව සිටී. ඊට හේතුව වාණිජත්වයට බර නො වූ පැරණි සමාජ ක්‍රමය තුල ස්ත්‍රීන් ආර්ථිකය සමග අද තරම් බද්ධ වී කටයුතු කළ යුතු නො වීය. නමුත් නූතන න්‍යෂ්ටික පවුලක ස්ත්‍රී



Scanned with CamScanner

සමාජිකාවකට ද පුරුෂයාට හා සමාන ව වගකීම් භාරයක් පැවරේ. එවැනි තත්වයක් තුළ ඇය ද අනෝමියත්වයට පත් වීමට ඇති ඉඩකඩ වැඩි ය. එබැවින් අනෝමීය සමාජ ක්‍රමයක් තුළ ජනප්‍රිය මාධ්‍යයෙන් (සිය දිවි නසා ගැනීමෙන්) ප්‍රශ්නවලට පිළියම් සෙවීමට ඇය ද දිශාගත ව සිටී.

ලංකා සමාජයේ ජාති කණ්ඩායම් අනුව සිය දිවි නසා ගැනීම පරීක්ෂා කිරීමේ දී වැඩි ම ජන සංඛ්‍යාවක් නියෝජනය කරන ජාතිකත්වය තුළ දිවි නසා ගැනීමේ ප්‍රමාණය වැඩි අගයක් ගත යුතු ව ඇතත් 1981 දී ද එහි ඊට වඩා වෙස් ස්වරූපයක් දැකිය හැකි බව පහත සංඛ්‍යාන වගුවෙන් අවබෝධ කර ගත හැකි ය.

### ජාති කණ්ඩායම් අනුව සියදිවි නසාගැනීමේ ප්‍රමාණය

(ජනගහණයෙන් දස ලක්ෂයකට)

| ජාතිය | ප්‍රමාණය |
|---|---|
| සිංහල | 36.6 |
| ශ්‍රී ලාංකීය ද්‍රවිඩ | 37.8 |
| ඉන්දීය ද්‍රවිඩ | 26.5 |
| මුස්ලිම් | 6.1 |
| වෙනත් | 5.5 |
| සියලු ජාතීන් | 34.2 |

මූලාශ්‍රය- Silva, Padmasiri de-*Suicide in Sri Lanka* 1989. (වගු අංක 02)

සමස්ත ලාංකික ජනගහණයෙන් 1/5 ක් පමණ වන දමිළ සාමාජිකයන් අතර ඉහළ සිය දිවි නසා ගැනීමේ රටාවක් වේ. ශ්‍රී ලාංකීය ද්‍රවිඩ හා ඉංදීය ද්‍රවිඩ යන දමිළ සාමාජිකයන් පොදුවේ ජනගහණයෙන් දස ලක්ෂයකට 32.2 පමණ සිය දිවි හානි කර ගනී, ජනගහණයෙන් බහුතරය නියෝජනය කරන සිංහල සාමාජිකයන් හා සැසඳීමේ දී එය විශාල අගයකි. 1981 වන විට ජාතිකත්ව ගැටලුව උග්‍ර ආකාරයෙන් සමාජය තුළ පිළිබිඹු නො වී තිබිය දීත් එකී තත්වය මෙවැනි විශාල අගයක් ගෙන ඇත. නමුත් නූතනයේ දමිළ සාමාජිකයන් අතර එය මීට වඩා ඉහළ අගයක් ගත යුතු වන්නේ ඔවුන් අතර පරාර්ථකාමී සිය දිවි නසා ගැනීම් අද බහුල හෙයිනි. කෙසේ වුවත් ඒ ඒ ජාති වර්ග තුළ සිටින සාමාජිකයන්ට සාපේක්ෂව දිවි නසා ගැනීම සෑම ජාති වර්ග වෙත ම බල පා ඇති බව පෙනේ.



Scanned with CamScanner

සී. එච්. එස්. ජයවර්ධන හා එච්. එස්. රණසිංහ 1966 දී ලංකාවේ බහුල වශයෙන් විදේශීය බලපෑම්වලට එක්වූ දකුණු පළාත අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස පදනම් කර ගනිමින් සියදිවි නසාගැනීම් පිළිබඳ පර්යේෂණයක් සිදු කර ඇත. විදේශීය ආක්‍රමණයන්ට මුලින් ම ගොදුරු වූයේ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ වන අතර ඉංග්‍රීසීන්ගෙන් පසු එය රට අභ්‍යන්තරයට ගලා යන ලදී. ඒ අනුව මුහුදු බඩ ජනයා දේශීය සංස්කෘතියට වඩා විදේශීය සංස්කෘතියට හුරු වී සිටියත් රට අභ්‍යන්තර ප්‍රදේශවල එවැනි තත්වයන් දැකිය නො හැක. නමුත් මේ මුහුද බඩ ප්‍රදේශත් රට අභ්‍යන්තරයේ ප්‍රදේශත් අතර "අතර මැදි සමාජ" (Intermediate Societies)විශේෂයක් පවතින බව ජයවර්ධන හා රණසිංහ ප්‍රකාශ කරති. ඒ "අතර මැදි ප්‍රදේශයේ" සාමාජිකයන් මේ සංස්කෘතීන් දෙකේ ගැටුමට හසු වන අතර ඔවුන් තුළ සිය දිවි නසා ගැනීම් වැඩි බව පෙන්වා දේ. ඒ අනුව මේ "අතර මැදි කලාපය" තුළ ඉහළ සිය දිවි නසා ගැනීම් ප්‍රමාණයක් වාර්තා වීමට හේතු වී ඇත්තේ දේශීය හා විදේශීය සංස්කෘතීන් අතර සිදු වන ගැටුම යි.

එලෙස ම ලංකාවේ නාගරික පරිසරය තුළට වඩා ග්‍රාමීය ව සිය දිවි නසා ගැනීම් ඉහළ අගයක් ගෙන ඇත. තවමත් ලාංකික ජනගහණයෙන් 73%ක් පමණ ග්‍රාමීය ව ජීවත් වන බව එහිදී සැලකිය යුතුය. එමෙන් ම Kearny සහ Miller (1978) ලංකාවේ කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල සිය දිවි නසා ගැනීම් වැඩි බව ප්‍රකාශ කරති. නිදසුන් ලෙස පොළොන්නරුව, අනුරාධපුරය, අම්පාර වැනි දිස්ත්‍රික්කයන්හි සිය දිවි නසා ගැනීම් කෙරෙහි ඉහළ දයකත්වයක් ද ගාල්ල, මාතර, කළුතර, කෑගල්ල වැනි ප්‍රදේශවල අඩු දයකත්වයක් ද වාර්තා වීමෙන් ඒ බව සනාථ වේ. ලංකාවේ වැඩිම සියදිවි නසා ගැනීම් සිදුවන ප්‍රදේශය තණමල්විල බව දැනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යානාංශය මගින් සිදුකරන පර්යේෂණයකින් අනාවරණය වී ඇත. කෘෂිකාර්මික ප්‍රදේශවල සිය දිවි නසා ගැනීම් වැඩි වශයෙන් සිදු වීමට ප්‍රධාන හේතුන් ලෙසින් ඒ ප්‍රදේශවල තිබූ නිසසල ග්‍රාමීය සහයෝගිතා අර්ථ ක්‍රමය දෙදරා යාමත්, වාණිජවාදී සමාජ රැල්ල තුළින් ගැමියාගේ සාමූහික සවිඥානය විනාශ කර දැමීමත් වේ. ඊට අමතර ව ග්‍රාමීය කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල සිය දිවි නසා ගැනීම් බහුල වීමට ද්විතියික හේතුන් වශයෙන් සිය දිවි තොර කර ගැනීමේ මාධ්‍යයක් ලෙස ලංකාවේ ග්‍රාමීය ගොවි ජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ඉඩකඩ සැකසී තිබීම යි. දිවි තොර කර ගැනීමේ උපක්‍රමයක් ලෙසින් වස පානය ඉතා ප්‍රචලිත මාධ්‍යයක් වී ඇති බව සංඛ්‍යාන දත්ත අනුව පෙනී යයි. "වස පානය" වෙත වැඩි ම ජනප්‍රියත්වයක් ලබා ඇති

## සිය දිවි නසා ගැනීමට භාවිත කරන ලද ක්‍රමයන්

(ජනගහණයෙන් දස ලක්ෂයකට)

| මාධ්‍යය | 1950 | 1955 | 1960 | 1965 | 1980 |
|---|---|---|---|---|---|
| වස පානය කිරීම | 116 | 168 | 400 | 1309 | 3482 |
| මුළු ගණනට දරන ලද ප්‍රතිශතය | 23.3 | 27.8 | 42.7 | 78.1 | 81.5 |
| වෙනත් ක්‍රම භාවිත කිරීම | 381 | 436 | 536 | 217 | 790 |
| මුළු ගණනට දරන ලද ප්‍රතිශතය | 76.7 | 72.2 | 57.3 | 11.9 | 18.5 |

මූලාශ්‍රය - 'ප්‍රතිමාන' 1993/94 කලාපය (වගු අංක 03)

සංඛ්‍යාන වගුවට අනුව 1950 දී වෙනත් සියලු ක්‍රම භාවිතයෙන් දිවි තොර කර ගත් ප්‍රමාණයට වඩා 1980 දී වස පානයෙන් දිවි තොර කර ගෙන ඇත. එමෙන් ම 1950 දී වස පානයෙන් දිවි තොර කර ගැනීම අඩු අගයක් ගැනීමෙන් පෙනී යන්නේ, නූතන ගැමියන්ට ඒ මාධ්‍යයට ප්‍රවේශ වීමට ඇති වැඩි ඉඩ කඩ නිසා එය ජනප්‍රිය මාධ්‍යයක් වීමට එක් හේතුවක්ව ඇති බවයි.

ලාංකික තරුණයන් අතර දිවිනසා ගැනීම බොහෝ වසයෙන් ප්‍රචලිත වීමට විවිධ සමාජයීය සාධක බල පා ඇත. පොදුවේ සමස්ත දිවි තොර කර ගන්නන්ගේ ඒ ක්‍රියාවට බල පාන ලද ආසන්න ම හේතූන් මෙසේ ය.

## සිය දිවි නසා ගැනීමට බලපාන ලද හේතූන්

(1975-1992 දක්වා)

| හේතුව | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රේම සම්බන්ධතා කඩා කප්පල් වීම | 17135 |
| දුප්පත්කම | 9124 |
| මානසික ආබාධ | 7115 |
| දෙමාපියන් වැඩිහිටියන් ගුරුවරුන් තරවටු කිරීම | 5480 |
| විරැකියාව | 3000 |
| විභාග අසමත් වීම | 1380 |
| ස්ථානමාරු | 388 |
| වෙනත් | |
| | 49050 |

* 1976 හා 1979 සංඛ්‍යා ලේඛන මීට ඇතුලත්ව නැත.

මූලාශ්‍රය - *Administration Report of the Inspector Genaral of Police 1975/1992* (වගු අංක 04)



Scanned with CamScanner

දිවි පොර කර ගැනීමට බලපාන ලද ආසන්න ම හේතුන් අනුව ප්‍රේම සබඳතා බිඳ වැටීම ඊට බල පා ඇති ප්‍රබල කරුණකි. ප්‍රේම සම්බන්ධතා බිඳ වැටීම කෙරෙහි දුප්පත්කම විරැකියාව වැනි වෙනත් නිලීන සාධකයන් ද බල පා තිබිය හැක. කෙසේ වුවත් දිවි නසා ගැනීමට බල පාන හේතුවක් ලෙසින් ප්‍රේම සබඳතා බිඳ වැටීම යන්න තරුණන්ට සුවිශේෂ වූ සාධකයකි. ඒ සාධකය ඉහළ අගයක් ගැනීමෙන් ම තරුණන් අතර සිය දිවි නසා ගැනීම් වැඩි බව පෙනී යයි. එය තව දුරටත් සනාථ කිරීමට පහත සඳහන් සංඛ්‍යා දත්ත පරීක්ෂා කළ හැකි ය :

## වයස් කාණ්ඩ අනුව සිය දිවි නසා ගැනීම්

(ජනගහණයෙන් දහසකට)

| වයස් කාණ්ඩය | මරණ ප්‍රමාණය |
|---|---|
| 15 - 19 | 6.6 |
| 20 - 24 | 12.6 |
| 25 - 29 | 13.7 |
| 30 - 34 | 13.7 |
| 35 - 39 | 15.9 |
| 40 - 44 | 9.4 |
| 45 - 49 | 7.1 |
| 50 - 54 | 7.1 |
| 55 - 59 | 8.0 |
| 66 - 64 | 6.7 |
| 65 - 69 | 8.7 |
| 70 - 74 | 11.4 |
| 75 - 79 | 6.8 |

මූලාශ්‍රය - Grant, John J, and wayal G. pritle - ***Social problems, As human concerns*** 1976 (වගු අංක 05)

මේ සංඛ්‍යා සටහනට අනුව වැඩි ම සිය දිවි නසා ගැනීම් ප්‍රමාණයක් වයස අවු 30-34 සහ 35-39 අතර තරුණ කාණ්ඩ වලින් දිස් වේ. (මෙය ලංකා සමාජයට අදල සංඛ්‍යා ලේඛනයක් නොවුන ද



Scanned with CamScanner

විශ්වීය වශයෙන් ද සියදිවි නසා ගැනීමේ දී තරුණයන් ඉදිරියෙන් සිටින බව ඉන් කියවේ.) තරුණයන් කෙරෙහි බලපාන සුවිශේෂ ගැටලුවලට ප්‍රමාණවත් විසඳුම් ලබා දීමට සමාජ ක්‍රමයන් අපොහොසත් වීම තරුණ ජනගහණය වැඩි වශයෙන් මරණය කෙරෙහි ප්‍රියතාවයක් දැක්වීමට හේතුවී තිබේ. එය තව දුරටත් පැහැදිලි කර ගැනීමට පහත සඳහන් සංඛ්‍යාන වගුව උපකාර කර ගත හැක.

## තරුණ සිය දිවි නසා ගැනීම් - වයස අවු:15-24 අතර

(ජනගහණයෙන් දස ලක්ෂයකට)

| වර්ෂය | 1950 | 1955 | 1960 | 1965 | 1970 | 1980 |
|---|---|---|---|---|---|---|
| මුළු ගණනින් තරුණයන්ගේ සිය දිවි නසා ගැනීම්වල ප්‍රතිශතය | 28.6 | 31.5 | 34.2 | 34.2 | 39.6 | 44.7 |
| අදාළ වර්ෂයේ මුළු මරණ සංඛ්‍යාවට තරුණ මරණ දැරූ ප්‍රතිශතය | 3.3 | 5.8 | 10.5 | 15 | 20.9 | 36.4 |

මූලාශ්‍රය - "ප්‍රතිමාන" **1993/94** කලාපය

(වගු අංක 06)

මෙයින් පෙනී යන්නේ ස්වකීය ජීවිතයේ තෙවැනි දසකයටවත් ළඟා වීමට පෙර ඇතැම් තරුණයන් සිය ජීවිතයෙන් සමු ගන්නා බවකි. මීට හේතුව පීතෘ මූලික ක්‍රමයක් දිස් වන ලාංකික සමාජය තුළ එහි සිදු වන්නාවූ සියලු වෙනස්වීම් පවුල් ඒකකයක් තුළ ප්‍රථම කොට ම දැනේනේ පුරුෂ සාමාජිකයන්ට වීම ය. පුරුෂ පක්ෂය වෙත පැවරී ඇති වග කීම් සම්භාරය අති විශාල ය. ඒ වග කීම් ඉටු කිරීමට ක්‍රමවත් සමාජ සම්මත මාර්ගයන් නොමැති වීම තුළින් තරුණයන් මේ තත්වයට පත් වේ යැයි මූලික වශයෙන් තර්ක කළ හැකි ය. තරුණයන් පෙළෙන දැඩි විරැකියාව ආර්ථික පීඩනය ඔවුන්ගේ ප්‍රශ්න ප්‍රකාශ කිරීමට නිදහස් මාධ්‍යයක් නොමැති වීම වැනි කරුණු ඊට බල පා ඇත. ලංකාව තුළ පමණක් නො ව විශ්වීය වශයෙන් ද තරුණ කොටස් අතර දිවි නසා ගැනීමේ සෙසු ජන කොටස්වලට සාපේක්ෂව ඉහළ අගයක් ගනී. (වගු අංක 05 බලන්න) සිය දිවි නසා ගැනීම් සමාජ ප්‍රශ්නයක් වශයෙන් සැලකීමේ දී මෙහි ඇති ඉතා ම ඛේදනීය තත්වය නම්, ඊට තරුණයන්ගේ දායකත්වය වැඩි වීම යි.



Scanned with CamScanner

මෙලෙස දිවි නසා ගන්නන් කුමන තත්වයක් යටතේ වර්ග කරමින් විග්‍රහ කළත් ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට විශේෂයෙන් 1975 න් පසු එය ඉතා ඉහළ අගයක් ගෙන ඇති බව පෙනේ. ඩර්කයිම්ගේ වර්ගීකරණයේ ප්‍රභේද තුනට ම ඇතුළත් වන සිය දිවි නසා ගැනීම් ලංකා සමාජය තුළ සිදු වුවත් ඉන් බොහොමයක් විරැකියාව, දරිද්‍රතාවය යන ආර්ථික ගැටළු ප්‍රමුඛ කරගත් වෛවාහික, ලිංගික හා ගෘහීය යන අනෙකුත් අනෝමියත්වයේ ආකාර අනුව සිදු වන බව පෙනේ. එනම්, ප්‍රේම සම්බන්ධතා කඩා කප්පල් වීම, කන්‍යාභාවය බිඳී යාම, අනියම් ගැබ් ගැනීම්, සහකරු හෝ සහකාරියේ අනාචාරයේ යෙදීම මානසික රෝග යනාදී අනෝමියත්වයේ ප්‍රභේද නිසා ලාංකිකයන් දිවි නසා ගන්නා බව යි.

## ආශ්‍රිත ලේඛන


(1) Disanayaka, S. A. W. and W. P. de Silva - ***Suicide and Attemped Suicide in Sri Lanka.*** Ceylon Journal of Medical Scince, Colombo 1974.

(2) Durkheim, Emile - ***Suicide; A stndy in Sociology*** (Translated by John Spaulding and Geofge simspon) Free Press New York, 1951.

(3) Grant, John. J. and Wayne G. pirtle - ***Social Problems; As human concerns*** Boys and Fraser Publishing Company, San francisco 1976 (pp 91-98)

(4) Silva, Padmasiri de - ***Suicide in Sri Lanka*** Institute of Fundamental Studies, Kandy 1989.

(5) Silva, K. T. and W. D. N. R. Pushpakumara - ***Suicide and Sexual anomie in new Settlement in Sri Lanka,*** Institute of Fundamental Studies, Kandy 1989.

(6) Sills, David L. - ***International Encyclopaedia of the Social Science***, Volume 15 (pp 375-396)

(7) ***Adiminiszration Report of Inspecter Genaral of Police*** 1975-1992.

(8) හේමන්ත කුමාර, එන්.වී. ජී. ඒ - සියදිවි නසා ගැනීමෙන් වාර්තා තබන ශ්‍රී ලාංකිකයන් "ප්‍රතිමාන" පළමු කාණ්ඩය, දෙවැනි කලාපය 1993/94 සමාජවිද්‍යා සංගමය, රුහුණු විශ්වවිද්‍යාලය (පිටුව 26-38)




Scanned with CamScanner

# 09

# සේවක අභිප්‍රේරණය

## "අභිප්‍රේරණය" යනු කුමක් ද?

"අභිප්‍රේරණය" (Motivation) යන වචනයට පර්යාය පද ලෙසින් අවශ්‍යතාවය (Needs) උවමනාව (want) හා ආශාව (Desirc) යන වචන භාවිත වේ. සෑම පුද්ගලයෙක් ම තම උවමානවක්, චේතනාවක්, හෝ අභිප්‍රායක් මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරති.

එෆ්. එච්. ස්පාක්ස් (F. H. Sparks) 1965 දී ප්‍රකාශයට පත් කරන ලද ***Genaral Psuchology*** නම් කෘතිය තුළින් අභිප්‍රේරණ න්‍යාය මගින් චර්යාවේ ආරම්භය එහි දිශාව හෝ එහි නැවැතීම සොයා බලන බව දක්වයි. ("James Drever") "ජේම්ස් ඩ්‍රිවර්" ට අනුව අභිප්‍රේරණය යනු යම් කාර්යයක් ඉටු කිරීම සඳහා දිරි දීම් හා යොමු කිරීම් දක්නට ලැනෙ අවස්ථාවන් ය. එමෙන් ම කිසි යම් කාර්යයක් ස්වේච්ඡාවෙන් මෙහෙය වනු ලබන ක්‍රියාවලිය අභිප්‍රේරණය ලෙස වික්ටර් වෘෘම් ("Victor H. Vroom") දක්වයි. පී. ටී. යන්ග් ("P. T. Young") ට අනුව අභිප්‍රේරණය එක්තරා ක්‍රියාවලියකි. ඒ ක්‍රියාවලිය සාධක කිහිපයක් මත පදනම් ව ඇත.

එනම්,

i. ප්‍රාථමික හැසිරීමක් මතු කර ලීම.
ii. කිසි යම් කාර්යයක් ක්‍රියාත්මක කර වීම.
iii. පවතින අවස්ථාවට ගැලපෙන අයුරින් ඒ කාර්යය කිරීම යනුවෙනි.

අභිප්‍රේරණ සංකල්පය කොටස් දෙකක් යටතේ කථා කිරීමට මනෝ විද්‍යාඥයින් පෙළඹී තිබේ. එනම්,



Scanned with CamScanner

i. ප්‍රාථමික අභිප්‍රේරණය (Primary Motivation)
ii. ද්විතියික අභිප්‍රේරණය (Secondary Motivation) යනුවෙනි.

ප්‍රාථමික අභිප්‍රේරණය හා ද්විතියික අභිප්‍රේරණය අතර වෙනස පැහැදිලි ව හඳුනා ගත නො හැක. නිදසුන් ලෙස කිසියම් පුද්ගලයෙකු රැකියාවක් කරන්නේ එමගින් යම් මුදලක් උපයා ගැනීමටය. ඔහු මුදල් උපයා ගන්නේ දේහ විද්‍යාත්මක අවශ්‍යතා සංතර්පනය සඳහා ය. මේ අනුව මුදල් ඉපයීම ප්‍රාථමික අභිප්‍රේරණය වන්නේ ද, ද්විතියික අභිප්‍රේරණය වන්නේ ද යන්න ස්ථිරව ම කිව නො හැක.

## වැඩ පිළිබඳ අභිප්‍රේරණය :

කර්මාන්ත හා සම්බන්ධිත පුද්ගලයන්ගෙන් කාර්යක්ෂම සේවාවක් ලබා ගන්නේ කෙසේ ද යන්න සෙවීම නැත හොත් කුමන සාධක පදනම් කර ගෙන පුද්ගලයා වැඩට යොමු කරවිය හැකි ද යන්න වැඩ පිළිබඳ අභිප්‍රේරණය නම් සංකල්පයේ සරළ අදහසයි. මුල් කාලීන ආර්ථික විද්‍යාඥයන් විසින් සේවකයා වැඩ කෙරෙහි යොමු වන සාධක සොයා බැලූ අතර ආර්ථික ප්‍රතිලාභ හෝ වැටුප් මත වැඩ කිරීම කෙරෙහි අභිප්‍රේරණය වන බව ඔවුන් කියා සිටින ලදී. සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින්ගේ මේ අදහස පුද්ගලයා තනි ආයෝජකයෙකු හෝ තනි සේවකයෙකු ලෙස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විග්‍රහයකි. මේ විග්‍රහය ඕස්ට්‍රේලියානු ජාතික, ඇමෙරිකානු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය 'එල්ටන් මේයෝ' (Elton Mayo, 1880-1949) ගේ පිළිගැනීමට ලක් වුණි. මේයෝගේ පිළිගැනීමට ලක් වූ මේ අදහස් පදනම් කර ගනිමින් 'එෆ්. ඩබ්. ටේලර්, (F. W. Taylor) 'විද්‍යාත්මක කළමනාකරණ න්‍යාය' (Scientific Management Theory) ගොඩ නගන ලදී. ටේලර් සාමාන්‍ය කම්කරුවෙකු වශයෙන් මිඩ්වේල් නම් වානේ කාර්මාන්තශාලාවකට බැදී ඒ සමාගමේ ම ප්‍රධාන ඉංජිනේරු තනතුර දක්වා උසස් වූ පුද්ගලයෙකි. ටේලර් මෙන් ම 'හෙන්රි පෙයෝල්' (Henry Fayol, 1841-1925) ද මෙහි දී වැදගති. ටේලර්ගේ අපේක්ෂාව වූයේ සේවකයින් වෙත ආර්ථික ප්‍රතිලාභ ලබා දීමෙන් වැඩි වැඩ ප්‍රමාණයක් ඉටු කරවා ගත හැකි විද්‍යාත්මක ක්‍රම. පරීක්ෂා කිරීම ය. ටේලර්ට අනුව සේවකයන් යන්ත්‍ර සූත්‍ර මෙන් ඉතා පහසුවෙන් හැසිරවිය හැක. කළ යුතු වැඩ ප්‍රමාණය පෙන්වා දී ඊට සාපේක්ෂ ව ආර්ථික ප්‍රතිලාභ ලබා දුන් විට සේවකයන් උපරිම හැකියාවෙන් වැඩ කරන බව ඔහුගේ අදහස විය. ඒ අනුව ටේලර් ගේ න්‍යායයේ මූලික හරය වන්නේ සේවකයින් වෙත ලබා දෙන ආර්ථික දීමනා මත වැඩවල කාර්යක්ෂමතාවය රඳා පවතින බවයි. එනම්, සේවකයා ආර්ථික මිනිසෙකු (Economic man) ලෙස ක්‍රියා



Scanned with CamScanner

කරන බවයි. ටේලර්ගේ මේ අදහස් සේවකයින්ගෙන් වැඩි වැඩ ප්‍රමාණයක් ඉටු කරවා ගන්නා ක්‍රම පරීක්ෂා කිරීමේ මුල් ම පියවර වන හෙයින් එය 'සම්භාව්‍ය න්‍යාය, විද්‍යාත්මක කළමනාකරණ න්‍යාය' නමින් සංකල්ප ගත කර ඇත. මේ සම්බන්ධ ව පසු කාලීනව බිහිවන න්‍යායාත්මක සංකල්පවලට මේ විද්‍යාත්මක කළමනාකරණ න්‍යායයෙන් මහ පෙන්වීමක් සිදු වේ. මින් පසු අභිප්‍රේරණ සංකල්පය වර්ධනය වීමේ පලබර කාලය වර්ෂ 1950 න් පසු ඇරඹේ.

## මානව සම්බන්ධතා ප්‍රවේශය (Human Relations Approach)

ආර්ථික මිනිසෙකු පිළිබඳ සාකච්ඡා කරන සම්භාව්‍ය අභිප්‍රේරණ න්‍යායය හෙවත් ටේලර්ගේ අදහස් පසු කාලීනව දැඩි විවේචනයන්ට භාජනය වීම නිසා සේවක අභිප්‍රේරණ සාධක පිළිබඳ සමාජ විද්‍යාඥයින් උනන්දු වන්නට විය. චිකාගෝ නුවර ඉලිනොයිස් ප්‍රාන්තයේ හෝර්තෝන්හි 'බටහිර විදුලි සමාගම' (western Electric Company) නම් ආයතනය පදනම් කොට ගෙන 1927-1932 අතර කාලයේ කරනු ලැබූ ආනුභාවික අධ්‍යානයක් තුළින් මානව සම්බන්ධතා ප්‍රවේශයට පදනම සැකසුනි. මේ බටහිර විදුලි සමාගමේ කරන ලද පර්යේෂණය 'හෝර්තෝන් (Hawthorn) පර්යේෂණය' නමින් ප්‍රකට විය. එහි දී සේවකයා සමාජයීය වසයෙන් හුදලා වූවෙකු හෝ තම ආදායම් උපරිම කර ගැනීම සඳහා ක්‍රියා කරන්නෙකු නො වන බවත් ඔහු සමාජයීය මිනිසෙකු (Social Man) බව ද ඉන් නිගමනය විය. ආර්ථික ප්‍රතිලාභ වැනි මතුපිටට පෙනෙන ද්‍රෂමය සාධකයන්ට වඩා පැහැදිලි ලෙසින් නො පෙනෙන නිලීන අන්තර් පුද්ගල සම්බන්ධතා සේවකයන් වැඩට යොමු වීම කෙරෙහි වැඩි බලපෑමක් කරන බව පෙනී යන ලදී. සේවා ස්ථානයෙන්හි මේ අන්තර් පුද්ගල සම්බන්ධතා හේතු කොට ගෙන අවිධිමත් සමූහ (Informal Groups) ගොඩ නැංවෙන බවත්, ඒ අවිධිමත් සමූහ දෛනිකව ඔවුන් නිෂ්පාදනය කළ යුතු ප්‍රමාණය පිළිබඳ ඒකමතික භාවයකට පැමිණ සිටිති. සේවා ස්ථානයක විධිමත් ක්‍රියා මාර්ගයන්ට වඩා සේවකයින් අවිධිමත් ලෙස බැස ගනු ලබන තීරණ නිෂ්පාදනය කෙරෙහි වැඩි වැදගත්කමක් ගන්නා බව නිරීක්ෂණය කරන ලදී. එය එසේ වූයේ සමූහ ප්‍රතිමාන ඔවුන් තුළ ගොඩ නැගී තිබීමෙනි. යම් ලෙසකින් සේවකයෙකු නියම ප්‍රමාණය ඉක්මවා වැඩ කළ හොත් හෝ අඩුවෙන් වැඩ කළහොත් අවිධිමත් සමූහය තුළින් ඔහුට ඒ වෙනුවෙන් දණ්ඩනයන් හිමි වේ. ඒ දණ්ඩනයන් පහත නීතිරීතිවලට අනුගත වේ.

i. නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් වැඩ නො කළ යුතු ය. නියමිත ප්‍රමාණය ඉක්මවා වැඩ කළ හොත් ඔබ රේට්බස්ටරයකු (Rate Buster) නැත හොත් 'මුදුනකු' වේ.



Scanned with CamScanner

ii. නියම ප්‍රමාණයට වඩා අඩුවෙන් වැඩ නො කළ යුතු ය. එසේ කළහොත් ඔබ වංචාකාරයෙකු (Chiseller) වේ.

iii. අවිධිමත් සමූහයට අවාසි වන අන්දමේ කිසිවක් විධිමත් පරිපාලන නිලධාරීන්ට නො කිව යුතු ය. එසේ කරන්නෙකු 'ද්‍රෝහියකු' (Squealer) වේ.

මුදුනකු නො වීමට, ද්‍රෝහියෙකු නො වීමට, හා වංචාකාරයෙකු නො වීමට සේවකයා ක්‍රියා කරන නිසා සෑම දෙනාගෙන්ම සමාන නිෂ්පාදනයක් ලැබේ. මේ අදහස වඩාත් න්‍යායාත්මක ව ඩේවිඩ් සිල්වර්මන් (David Silverman) ඔහුගේ ***The Theory of Organization*** නම් 1978 දී ප්‍රකාශයට පත් වූ කෘතිය තුළ ගොනු කරයි. එනම්, සේවකයා තම වැඩ ඉටු කිරීම සඳහා මෙහෙයවනු ලබන අභිප්‍රේරණමය සාධකයක් ලෙස තමා හා වැඩ කරන සෙසු පුද්ගයින් සමග අන්තර් සම්බන්ධතා පවත්වා ගැනීමේ අවශ්‍යතාවයත්, ඔවුන් අතර පිළිගැනීමට ලක් වීමත්, වැදගත්වේ ය, යන්න පෙන්වා දෙනු ලැබී ය. එනම්, කර්මාන්ත ශාලාව එක්තරා සමාජ ක්‍රමයක් (Social System) ලෙසත්, සේවකයා ඒ තුළ සිටින සමාජ මිනිසෙකු (Social Man) ලෙසත් නව ආකෘතියක් ඉදිරිපත් කිරීමට මානව සම්බන්ධතාවාදීන් සමත් විය.

විද්‍යාත්මක කළමනාකරණවාදී අදහස්වලට ප්‍රතිචාරයක් ලෙසින් බිහිවූ මානව සම්බන්ධතා න්‍යායේ පසුකාලීන වර්ධන අඩියර කීපයකි. ඒ අතර පහත සඳහන් ඒවා වැදගත් වේ.

01. මැස්ලෝ න්‍යාය. (Maslow's Theory)

02. ද්වි සාධක න්‍යාය (Two factor Theory)

03. ඊ. ආර්. ජී. ආකෘතිය (E. R. G. Model)

04. එක්ස් න්‍යාය හා වයි න්‍යාය (Theory x and Theory Y)

05. අපේක්ෂණ වාදය (Expectancy Theory)

**මැස්ලෝ න්‍යාය : (Maslow's Theory)**


මිනිසා වැඩ කෙරෙහි යොමු කරවීමට මානව සම්බන්ධතා නැත හොත් සේවාස්ථානය හා සම්බන්ව ගොඩනැගෙන සමජයීය පරිසරය පමණක් නො ව ඊට වඩා සංකීර්ණ සාධක බල පාන බව 'ඒබ්‍රහම් එච්. මැස්ලෝ' (Abraham H. Maslow) ගේ අදහසයි. මිනිස් අවශ්‍යතාවන්හි වැදගත්කම අනුව ඔහු සරළ හා මූලික අවශ්‍යතාවන්හි සිට

ස්වයංසාධනය නමැති සංකීර්ණ අවශ්‍යතාවය දක්වා 'අවශ්‍යතා ධූරාවලිය' (Hierachy of Needs) ක් ඉදිරිපත් කරයි. ඔහු 'මානව අභිප්‍රේරණය පිළිබඳ න්‍යායක්' (*A Theory of Human Motivation*) නම් කෘතියෙන් 'මානව අභිප්‍රේරණය හා සංවිධාන චර්යාව' (Human Motivation and Organizational Behaviour) පිළිබඳ මේ සුප්‍රකට දැනුම ඉදිරිපත් කරයි.

**මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය**
(රූප සටහන් අංක 01)

ඉහළ තලයේ අවශ්‍යතා
(Higher order Needs)
(3) + (4) + (5)

පහළ තලයේ අවශ්‍යතා
(Lower order Needs)
(1) + (2)




(1) දේහ විද්‍යාත්මක අවශ්‍යතා (Physiological / Biological Needs)
(2) ආරක්ෂණ අවශ්‍යතා (Safety / Security Needs)
(3) සමාජමය, ස්නේහමය අවශ්‍යතා (Social or Love Needs)
(4) සම්මානිත අවශ්‍යතා (Esteem Needs)
(5) ස්වයං සාධනීය අවශ්‍යතා (Self Actualixation)

මූලාශ්‍රය :- Rao, V. S. P. and P. S. Narayana-*Organization Theory and Behaviour* 1992

මානව අවශ්‍යතාවන් ස්ථර පහක් (Five Level) යටතේ මෙහි සංක්ෂිප්ත කර (Schemalic) දක්වා ඇත. මේ අවශ්‍යතා ධූරාවලියේ පහළ ම ස්ථරය දේහවිද්‍යාත්මක නැතහොත් කායික අවශ්‍යතාය. තම ශරීරය පවත්වා ගැනීමට අවශ්‍ය ආහාර (Food) නිවාස (Shelter) ඇඳුම් පැළඳුම් (Clothing) ඒ ස්ථරයෙන් අදහස් වේ. මේ අවශ්‍යතා මිනිසාගේ ප්‍රධාන අවශ්‍යතා ය. මේ අවශ්‍යතා ඉටු වුවහොත් පමණක් මිනිසා අන් අවශ්‍යතා කෙරේ උනන්දු වේ.

මෙහි දෙවන ස්ථරය ආරක්ෂක අවශ්‍යතාවයන් ය. පළමු ස්ථරයේ අවශ්‍යතා ඉටු වීම මත පමණක් ආරක්ෂක අවශ්‍යතා කෙරෙහි උනන්දු වේ. ආරක්ෂක අවශ්‍යතා කොටස් කීපයකි.

i. Proection from physiological dangers (fire, accident)
ii. Economic Security (Fringe benifits, helth, insurance programmes)
iii. Desire for orderly, Predicatable environment.
iv. Limits of acceptable behaviour.

ශාරීරික අවශ්‍යතා හා ආරක්ෂක අවශ්‍යතා යන පහළ ස්ථරයේ අවශ්‍යතා ඉටු වූ කල්හි පමණක් ඉන් ඉහළ ස්ථරවල අවශ්‍යතා ගැන උනන්දු වේ.

මැස්ලෝගේ ධූරාවලියේ තෙවන ස්ථරය වන සමාජමය අවශ්‍යතා නැතහොත් ස්නේහය අවශ්‍යතා යන්නෙන් නියෝජනය වන්නේ ජාත්‍යර්ථය, (C͡nnotations) ලිංගිකත්වය යන කරුණු ය. මේ ස්ථරය හැඳින්විම සඳහා මැස්ලෝ යොදා ගත් "Social Needs" යන්නේ අඩු පාඩුකම් දක්වන එෆ්. ලූතන්ස් (F. Luthans) ඔහුගේ සංවිධාන චර්යාව *[Oraganizational Behaviour* (1973, pp 407)] නම් කෘතියේ මේ ස්ථරය හැඳින්වීම සඳහා යෝග්‍ය වචනයක් ලෙස "Belongingness" යන්න දක්වයි. ඉන් අදහස් වන්නේ ආදරය ලැබීම, ආදරය ප්‍රකාශ කිරීම (Giving and receiving Love) යන මානසික අවශ්‍යතාවයයි.

මැස්ලෝගේ ධූරාවලියේ සිව්වන ස්ථරය සම්මානික අවශ්‍යතාව වේ. එනම්, වැදගත් කොට සැලකීමේ උවමනාවයි. මින් ප්‍රකාශ වන්නේ.

i. ලෙඩ රෝග නැති බව නැත්නම් නිරෝගී බව
ii. පහළ ස්ථරවල අවශ්‍යතා ස්වකීය සියළු උවමනාවන් පිරිමසාගත හැකි අයුරින් සපුරාගෙන තිබීම
iii. තමා තමන්ගේ අවශ්‍යතා ධනාත්මක ලෙස වර්ධනය කර ගැනීමේ දක්ෂයෙකි යන අදහස සහ
iv. නීති ගරුක පුරවැසියෙකි යන පිළිගැනීම යනාදිය වේ.

මේ අනුව සම්මානික අවශ්‍යතා නැවත වර්ග කළ හැක. එනම්,

i. Self Esteem
ii. Esteem of others යනුවෙනි.

තමාගේ ආත්මය පිළිබඳ තම සිත තුළ ඇති වන අභිමානය, ආත්මාභිමානය පළමු වැන්නෙන් අදහස් වේ. අන් සාමාජිකයන් ද තමා පිළිගැනීමට ලක් කිරීම දෙවැන්නෙන් අර්ථවත් වේ.

මැස්ලෝගේ ධුරාවලියේ අවසන් හෙවත් පස් වැනි ස්ථරය ස්වයං සාධනීය අවශ්‍යතාවයි. එනම් සංගීතඥයෙකු සංගීතය නිර්මාණයටත් (A musican must make music) කවියෙකු නිර්මාණ කරණයටත් (A poet must write) සේනාධිපතියෙකු යුද්ධය දිනීම සඳහාත් (A Genaral must win battles) චිත්‍ර ශිල්පියෙකු චිත්‍ර කර්මයටත් (An Artist must paint) ගුරුවරයෙකු ඉගැන්වීම සඳහාත් (A Teacher must teach) යනාදි ලෙස උපරිම සංතෘෂ්ටියකින් තම සේවාවන්හි යෙදීම අදහස් වේ. සේවකයින් උපරිම සංතෘෂ්ටියට පත්වීම නැත හොත් ස්වයං සාධනීය තත්වයට පත්වීමට ඊට පහළ සියලුම ස්ථරවල අවශ්‍යතා නිසි පරිදි ඉටුවිය යුතු ව තිබේ. එබැවින් මේ ස්ථරය වර්ධනීය (growth) එකක් වන අතර එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

අනුමාන වසයෙන් සිතා බැලීම් මත පිළියෙල වී ඇති මේ ධුරාවලියෙහි ශාරීරික අවශ්‍යතා 85%කින්ද, ආරක්ෂක අවශ්‍යතා 70% කින් ද, ස්නෙහය අවශ්‍යතා 50%කින්ද , සම්මානික අවශ්‍යතා 40% කින්ද, ස්වයං සාධනීය අවශ්‍යතාව 10% කින්ද ලෙස ඉටු වූ කල සාමාන්‍ය මිනිසෙකු තෘප්තිමත් වේ.

මැස්ලෝට අනුව මෙතෙක් ඉටු නො වූ අවශ්‍යතාවන් පුද්ගලයාගේ හැසිරීම මෙහෙය වන අභිප්‍රේරණ ලෙස ක්‍රියාත්මක වේ. සමූහයක පිළිගැනීමට ලක්වීම, ඊට අනුරූපී වීම, යන පොදු අභිප්‍රේරණයන්ට අනුව පුද්ගලයන්ට සාපේක්ෂව වෙනස් වන අභිප්‍රේරණ ධුරවලියක් පාදක කොට ගෙන පුද්ගලයා වැඩට යොමු වේ. පහළ තලවල අවශ්‍යතා සංතෘප්ත වූ විට ඉහළ තලවල අවශ්‍යතා කෙරෙහි යොමු වන බැවින් සේවකයින්ගෙන් වැඩි වැඩ ප්‍රමාණයක් ඉටු කරවා ගැනීමට නම් කළමනාකරුවකු ගේ මූලික කාර්යභාරය විය යුත්තේ ස්වයං සාධකනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම බව ඩේවිඩ් සිල්වර්මන් [David Silverman (1978)] දක්වයි.

මානව අවශ්‍යතාවන් ධුරවල පදනමකින් පෙළ ගැස්විය නොහැකි බවත් මිනිස් අවශ්‍යතා එකක් පිටුපස එකක් පැමිණෙන ස්වභාවයක් දැකිය නො හැකි බවත්, අවශ්‍යතා කිහිපයක් වුව එක වර මතු විය හැකි බවත්, යන විවේචන මැස්ලෝගේ අදහස්වලට එල්ල වේ. නමුත් මානව සම්බන්ධතා ප්‍රවේශයේ පසු කාලීන වර්ධන අවධීන්වලට මැස්ලෝගේ අදහස් ආලෝකයක් විය.



Scanned with CamScanner


## ද්වි සාධක න්‍යාය :-(Two Factor Theory)

ප්‍රෙඩ්රික් හර්ස්බර්ග් {Frederick Herzberg (හා ඔහුගේ සගයන්)} 1959 දී වැඩට අභිප්‍රේරණය ***(The Motivation to work)*** නම් කෘතිය තුළින් මේ පිළිබඳ අදහස් දක්වයි. හර්ස්බර්ග්ට මේ කාර්යයට සහාය වූවන් අතර බී. මෞස්නර් ("B. Mausner") සහ බී. ස්නයිඩර්මන් ("B. Snydernan") ද වේ. හර්ස්බර්ග් ඇතුළු මේ කණ්ඩායම ඇමෙරිකා එක්සත් ජනපදයේ පීටර්ස්බර්ග් හි එකිනෙකට වෙනස් කර්මාන්ත නමයක් තෝරා ගෙන ඒවායේ ගනකාධිකාරීවරුන් (Accountants) සහ ඉංජිනේරුවන් දෙසීයක නියදියකින් වෘත්තිමය විෂය පිළිබඳ සම්මුඛ පරීක්ෂණ පවත්වමින් අධ්‍යයනයක් කරන ලදී. පර්යේෂණය කරන මොහොත වන විට තමා කරමින් සිටින හෝ සිටිය වෘත්තිය කාර්යභාරය පිළිබඳ ප්‍රශ්න කරන ලදී. එනම්, ඊට කැමැති ද නැද්ද (like or dislike) යන්නයි. මේ අදහස් මත ද්වයිත සාධක න්‍යාය (Dual Factor Ttheorg) සනීපාරක්ෂක සාධක න්‍යාය (Motivation Hygine Theory) ගොඩ නංවන ලදී. අභිප්‍රේරණය හා සෞඛ්‍යය නැතහොත් සනීපාරක්ෂාව යන සංකල්ප අශ්‍රිත ව මේ අදහස් ගොඩ නැගී ඇත. හර්ස්බර්ග් ට අනුව වැඩ හා සම්බන්ධ සංතෘෂ්ටිය හා අසංතෘෂ්ටිය යනු එක ම තලයක විරුද්ධ පැති දෙකක් නො වේ. සේවකයාට තම වැඩවලින් ලැබෙන සතුට ඔහු ඒ සඳහා යොමු කරවන අභිප්‍රේරණයකි. සෞඛ්‍ය සාධකයන් මගින් සේවකයා තුළ පවතින අසංතෘෂ්ටිය අඩු කරලීම සිදුවේ. සනීපාරක්ෂක හෙවත් සෞඛ්‍ය සාධක යන්නෙන් අදහස් වන්නේ සේවස්ථානයේ වැඩ සඳහා සුදුසු බාහිර පරිසරයක් (Enviornmental, external to job) තිබීමයි. සුපර්වයිසර්වරුන් හා සේවකයින් අතර සම්බන්ධතාව (Relation ship with Supervisor) ආයතනයේ අධිපතීන් හා සේවකයින් අතර සම්බන්ධතාවක් පැවැතීම (Relation ship with Peers) ආයතනයේ උප කළමනාකරුවන් හා සේවකයින් අතර සම්බන්ධතාවක් පැවතීම (Relation with Subordinates) ප්‍රමාණවත් වැටුපක් ලැබීම, ප්‍රමාණවත් ආරක්ෂාවක් තිබීම, පෞද්ගලික ජීවිතයක් තිබීම, සමාගමේ ක්‍රමවත් පාලනයක් හා අධීක්ෂණයක් තිබීම, ක්‍රමවත් ප්‍රතිපත්තීන් තිබීම යනාදියයි. සේවකයින් සංතෘෂ්ටිමත් වන පහසුකම් සැපයීම සංවිධානයක කාර්යක්ෂමතාවක් ඇතිකරලීම සඳහා අවශ්‍යවන බව මින් ප්‍රකාශ වේ.

මැස්ලෝ ඉදිරිපත් කළ අවශ්‍යතා ධුරාවලිය පිළිබඳ අදහස හා හර්ස්බර්ග්ගේ ද්විසාධක න්‍යාය සංසන්දනය කිරීමක් කළ හැක.

Scanned with CamScanner

මැස්ලෝ න්‍යාය හා ද්විසාධක න්‍යාය සංසන්දනය
(රූප සටහන් අංක 02)




මූලාශ්‍රය :- Rao, V. S. P. and P. S. Narayana - *Organization Theory and Behaviour* 1992.

මැස්ලෝගේ න්‍යායයෙහි ස්ථර තුනෙහි අවශ්‍යතා සනීපාරක්ෂක කරුණු ලෙස ද ඉහළ ස්ථර වල අවශ්‍යතා "Motivators" ලෙස ද දක්වා ඇත.

**ඊ. ආර්. ජී. ආකෘතිය :- (E. R. G. Model)**


සී. ඇල්ඩෆර් (C. Alderfer) විසින් ***Human needs in Organizational Sittings*** නම් කෘතියේ ඊ. ආර්. ජී. ආකෘතිය පිළිබඳ අදහස් ප්‍රකාශයට පත් කරයි. මැස්ලෝ ස්ථර 5 ක් යටතේ ඉදිරිපත් කළ අවශ්‍යතා ස්ථර තුනක් යටතේ ගොනු කරයි. එනම්,

ජීවත්වීම Existence,

සම්බන්ධතා Relatedness හා

වර්ධනය Growth යනුවෙනි.

**මැස්ලෝ න්‍යාය හා ඊ. ආර්. ජී. ආකෘතිය සැසඳීම**
**(රූප සටහන අංක 03)**




මූලාශ්‍රය :- Rao, V. S. P. and P. S. Narayana - *Organization Theory and Behaviour.* 1992

ශරීරික හා ආරක්ෂණ යන මැස්ලොගේ න්‍යායයෙහි අවශ්‍යතා ස්ථර දෙක ජීවත්වීමේ අවශ්‍යතා (Existence Needs) ලෙස දක්වයි. සමාජ අවශ්‍යතාව නැත හොත් ස්නේහමය අවශ්‍යතාව සම්බන්ධතාමය අවශ්‍යතා (Relatedness Needs) ලෙස ඊ. ආර්. ජී. ආකෘතිය තුළ වේ. සම්මානික අවශ්‍යතාව හා ආත්ම සාධනීය අවශ්‍යතාව යන සිව් වැනි හා පස් වැනි ස්ථර දෙක වර්ධනීය අවශ්‍යතා (Growth Needs) ලෙස දක්වේ.

**එකස් න්‍යාය හා වයි න්‍යාය :-** (Theory X and Theory Y)

ඩී. මැක්ග්‍රෙගර් (D. Mc. Gregor) විසින් එක්ස් න්‍යාය හා වයි න්‍යාය ඉදිරිපත් කරන ලදී, එක්ස් න්‍යාය හා වයි න්‍යාය පිළිවෙලින් සාම්ප්‍රදායික කළමනාකරණ හා නූතන කළමනාකරණ න්‍යාය සංකේතවත් කරයි. එනම්, මේ පිවිසුම් දෙක සේවකයා සම්බන්ධයෙන් කළමනාකරුවන් දක්වන ප්‍රතිවිරුද්ධ ආකල්ප දෙකක් පිළිබිඹු කරයි. ඉන් X න්‍යාය ඍනාත්මක නැතහොත් නිශේධනාත්මක (Negetive) එකක් ලෙස ද Y න්‍යාය සාධනීය හෙවත් ධනාත්මක (Positive) එකක් ලෙස ද

ප්‍රකාශිත ය. මැක්ග්‍රෙගර්ට අනුව X න්‍යායට නැඹුරු වන කළමනාකරු සේවකයන් සම්බන්ධව පහත දැක්වෙන උපකල්පන පිළිගනියි.

(1) මිනිසා ස්වභාවයෙන්ම වැඩට කම්මැලි අතර ඔහු නිතර වැඩ මග හැරීමට බලයි.

(ii) එබැවින් ඔහුගෙන් බලයෙන් හා තර්ජනයෙන් වැඩ ගත යුතු ය.

(iii) වගකීම් බාරගැනීමටද අකැමැතිය.

(iv) වැඩිදෙනා සිය ආත්ම ආරක්ෂාව ඉක්මවා අරමුණු නො කරයි.

අනෙක් අතට Y න්‍යායට නැඹුරුවන කළමනාකරුවෙකු සේවකයා සම්බන්ධයෙන් මෙවැනි උපකල්පන දරයි.

(i) සේවකයා වැඩ අප්‍රිය නො කරයි. ක්‍රීඩා කිරීම මෙන් ම වැඩ කිරීම ද ඔහුට සතුටු දනවන ක්‍රියාදාමයකි.

(ii) අවස්ථාව අනුව සේවකයන් සංවිධානයේ පරමාර්ථ සඳහා කැපකර ගත හැක.

(iii) ස්වයං අධ්‍යක්ෂනයක් හා ස්වයං පාලනයකින් යුතුව පැවරුන වගකීම් බාර ගැනීමට සේවකයන් කැමැති කරවා ගත හැක.

X න්‍යායේ හා Y න්‍යායේ සඳහන් ප්‍රතිවිරෝධී උපකල්පන දෙවර්ගය වෙනස් කළමනාකරණ නායකත්ව ශෛලීන් බිහි කරන්නේ ය. X න්‍යායේ අදහස් මත පිහිටන කළමනාකරු ආධිපත්‍යමය නායකත්වයක් දරයි. Y න්‍යායේ අදහස්වලින් පෝෂිත කළමනාකරුවන් සහභාගිත්ව, ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වයක් විදහා පාති. මේ අනුව Y න්‍යාය සේවක අභිප්‍රේරණය සඳහා වඩා උචිත බව පෙන්වා දේ.

**අපේක්ෂණ වාදය :- (Expectancy Theory)**

වික්ටර් වෘම් (Victor Vroom) සේවක අභිප්‍රේරණය පිළිබඳ මැස්ලෝ සහ හර්ස්බර්ග් නො දුටු පැත්තක් පෙන්වාදේ. මැස්ලෝ සහ හර්ස්බර්ග් වාස්තවික අභිප්‍රේරණ සාධක ගවේෂණය කළ අතර අපේක්ෂණ වාදය මගින් පුද්ගලානුබද්ධ අභිප්‍රේරණ සාධක සොයා බලන ලදී.

පුද්ගලයෙකුට යම් කාර්යයක් මුදුන් පත් කර ගැනීමට ඇති අභිප්‍රේරණ ශක්තිය, එම පුද්ගලයා තුළ සාධක දෙකක් සම්බන්ධයෙන්



Scanned with CamScanner


පවතින්නාවූ අපේක්ෂණ ප්‍රමාණය මත රැඳී තිබෙන බව අපේක්ෂණවාදීන් අදහස් කරති. ඒවා නම්,

1. උත්සාහය තුළින් කාර්ය සාධනය කර ගැනීමේ අපේක්ෂනය

ii. කාර්ය සාධනය නිසා ප්‍රදනයන් ලැබීමේ අපේක්ෂණය යනුවෙනි.

**අපේක්ෂණ වාදය**

(රූපසටහන අංක 04)




මූලාශ්‍රය :- ජයසිංහ, ශ්‍යාමන්, **කළමනාකරණ හැඳින්වීම** 1992

මෙහි දී අපේක්ෂණය යන්නෙන් අදහස් වන්නේ එක් සිද්ධියක් තවත් සිද්ධියකට තුඩු දීමේ සම්භාවිතාවය පිළිබඳ සංජානනයයි. විභාගයකට පෙනී සිටින සේවකයෙකුට ඒ විභාගයෙන් ජය ගතහැකි යැයි දැඩි අපේක්ෂකයන් පවතී නම් ඔහු ඒ සඳහා නිසි උත්සාහයක් දරනු ඇත. අනෙක් අතට විභාගය කුමන අන්දමකින් හෝ සමත්වීමට නො හැකි යැයි ඔහුට හැඟී ගිය හොත් ඔහු තුළ ඒ සඳහා අභිප්‍රේරණයක් ඇති වේ යැයි සිතිය නො හැක. එමෙන් ම තමා පෙනී සිටින විභාගය සමත් වීම හේතු කොට ගෙන ප්‍රදනයක් ලැබේ නම් ඔහු ඒ සඳහා දැඩි උත්සාහයක් දැරිය හැක. මේ අනුව අපේක්ෂණ දෙවර්ගයේ ප්‍රමාණය මත යමෙකුගේ සමස්ත අභිප්‍රේරණය ද අඩු හෝ වැඩි වේ. එලෙස ම ලැබෙන ප්‍රදානය උත්තේජනයක් වීමට නම් එය සේවකයා අගය කරන එකක් ද විය යුතු ය.



Scanned with CamScanner

## සාකච්ඡාව

සම්භාව්‍ය විද්‍යාත්මක කළමනාකරණ න්‍යායේ සිට ඉදිරිපත් ව ඇති සේවක අභිප්‍රේරණ න්‍යායන් කිහිපයක් ඉහතින් සාකච්ඡා කර ඇත. සේවකයා හා සම්බන්ධ අභිප්‍රේරණ සාධක තනි න්‍යායකින් විග්‍රහ කළ නො හැකි බව ඉන් අවබෝධ විය. සේවකයා ආර්ථික මිනිසෙකුගේ සිට සමාජයීය මිනිසෙකු, සංකීර්ණ මිනිසෙකු යැයි සිතීමට කළමනාකරුවන් පෙළඹී ඇති ආකාරයක් මේ අභිප්‍රේරණ න්‍යායන් තුළින් වටහා ගත හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ


(1) Coffey, Robert E. - *Behaviour in Organization*
Prentic - Hall New Jersey 1975.

(2) Etzioni, Amitai - *Modern Oreganization*
Prentic - Hall of India
New Delhi 1976.

(3) Hodgets, Richard. M. and Steven Altman - *Organizational Behaviour*
W. B. Saunders Company 1979.

(4) Hellriegel, D and J. W. Slocum - *Management*
New york 1978.

(5) Maslow, Abraham. H. - *A Theory of Human Motivation*
1943. (pp 370-396)

(6) Robbins, Stephen, p. - *Organizational Behaviour*
sixth Edition
Prentice-Hall of India
New Delhi 1995 (pp 205-220)

(7) Rao, V. S. P. and P. S. Narayna - *Organization theory and Behaviour*
Konark publishers India 1992

(8) ජයසිංහ, ශ්‍යාමන් - **කළමනාකරණය හැඳින්වීම**
සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
කොළඹ 1992 (පිටුව 109-122)

(9) රුහුණ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යයන කවය - **සංකලන**
මංගල කලාපය 1992
(පිටු, 21-40,49-64) එම දෙවැනි කලාපය
1993 (පිටුව 36-43)




Scanned with CamScanner

# සමාජවිද්‍යාව :
# විවරණාත්මක ලිපි

රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන ඒ. කේ. ජී. ජයසිංහ සහ එහි ම කථිකාචාර්යවරයකු වන එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර මේ කෘතියේ කතුවරුන් වේ.

විශ්විද්‍යාලය තුළ ඉගැන්වීමෙන්, පර්යේෂණයන්හි තියැලීමෙන්, හා පොතපත කියවීමෙන් ලත් දැනුම මේ කෘතිය සාරවත්ව පෝෂණය කිරීමට ඔවුන්ට ඉවහල්ව ඇත.

විශ්වවිද්‍යාල අභ්‍යන්තර හා බාහිර උපාධි පරීක්ෂණවල විෂය නිර්දේශයන්ට අදල මාතෘකා කීපයකින් මේ ග්‍රන්ථය සකස්ව තිබේ. ඒ තුළ සමාජවිද්‍යාවේ විවිධ උපවිෂය ක්ෂේත්‍රයන්හි මාතෘකා හා ශ්‍රී ලංකා සමාජයේ නොයෙක් අංශ පිළිබඳව සමාජවිද්‍යාත්මක විවරණ [illegible]. එබැවින් විශ්විද්‍යාලවල අභ්‍යන්තර හා බාහිර විභාගවලට මෙ[illegible] සමහර මාතෘකා සෘජුවම අදල වේ.

සමාජවිද්‍යාත්මක දැන නුවන ලබා ගැනීමට වෙහෙසෙන සෙසු පාඨකයින්ටද මෙය ප්‍රයෝජනවත් කෘතියකි.

---

ISBN - 995-20-2056-5

මිල රු. 125/-

එස්. ගොඩගේ සහ සහෝදරයෝ
පොත් ප්‍රකාශකයෝ සහ බෙදාහරින්නෝ
675, මරදාන පාර, කොළඹ 10.

Scanned with CamScanner